# කාර්යසාධන වාර්තාව

# 2025

**රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය**

**2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව**

**රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය**

**ශීර්ෂ අංකය 338**

**පටුන**


| | පිටුව |
|---|---|
| **1 ආයතනික පැතිකඩ / විධායක සාරාංශය** | |
| 1.1 හැඳින්වීම | 1 |
| 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු සහ ඉලක්ක | 1 |
| 1.3 ප්‍රධාන කාර්යයන් | 2 |
| 1.3.1 ඉදිරි කාර්යාලය | 2 |
| 1.3.1.1 දේශීය ණය ගැනීමේ ඒකකය (DBU) | 2 |
| 1.3.1.2 විදේශීය ණය ගැනීමේ ඒකකය (EBU) | 3 |
| 1.3.1.3 ආයෝජක සබඳතා සහ වෙළඳපොළ සංවර්ධන ඒකකය (IRU) | 4 |
| 1.3.2 මධ්‍යම කාර්යාලය | 5 |
| 1.3.2.1 ප්‍රතිපත්ති සහ විශ්ලේෂණ ඒකකය (PAU) | 5 |
| 1.3.2.2 ණය අවදානම් විශ්ලේෂණ සහ අධීක්ෂණ ඒකකය (CRA&MU) | 6 |
| 1.3.2.3 අවදානම් පාලන සහ අනුකූලතා ඒකකය (RCCU) | 6 |
| 1.3.3 පසුපස කාර්යාලය | 6 |
| 1.3.3.1 ණය සටහන් කිරීමේ ඒකකය (DRU) | 6 |
| 1.3.3.2 ණය සේවාකරණ ඒකකය (DSU) | 8 |
| 1.3.3.3 ණය සංඛ්‍යාලේඛන සහ වාර්තාකරණ ඒකකය (DS&RU) | 9 |
| 1.3.4 පාලන හා මුදල් අංශය | 10 |
| 1.4 2025 දෙසැම්බර් මස 31 දිනට සංවිධාන ව්‍යුහය | 11 |
| | |
| **2 ප්‍රගතිය සහ පෙරදැක්ම** | |
| 2.1 ඉදිරි කාර්යාලය | 12 |
| 2.1.1 දේශීය ණය ගැනීමේ ඒකකය (DBU) | 12 |
| 2.1.2 විදේශීය ණය ගැනීමේ ඒකකය (EBU) | 13 |
| 2.1.3 ආයෝජක සබඳතා සහ වෙළඳපොළ සංවර්ධන ඒකකය (IRU) | 14 |
| 2.2 මධ්‍යම කාර්යාලය | 15 |
| 2.2.1 ප්‍රතිපත්ති සහ විශ්ලේෂණ ඒකකය (PAU) | 15 |
| 2.2.2 ණය අවදානම් විශ්ලේෂණ සහ අධීක්ෂණ ඒකකය (CRA&MU) | 16 |
| 2.2.3 අවදානම් පාලන සහ අනුකූලතා ඒකකය (RCCU) | 18 |
| 2.3 පසුපස කාර්යාලය | 19 |
| 2.3.1 ණය සටහන් කිරීමේ ඒකකය (DRU) | 19 |
| 2.3.2 ණය සේවාකරණ ඒකකය (DSU) | 24 |
| 2.3.3 ණය සංඛ්‍යාලේඛන සහ වාර්තාකරණ ඒකකය (DSRU) | 25 |
| | |
| **3 2025 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්යසාධනය** | |
| 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | 27 |
| 3.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 29 |
| 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 30 |
| 3.4 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් | 32 |
| 3.5 ප්‍රතිපාදන භාවිත කිරීමේ කාර්යසාධනය | 33 |
| 3.6 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය - 2025 | 33 |
| 3.7 විගණකාධිපති වාර්තාව | 33 |
| **4 කාර්යසාධන දර්ශක** | 34 |

| | |
|---|---|
| **5 තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය** | |
| 5.1 තිරසාර සංවර්ධන ඉලක්ක | 34 |
| | |
| **6 මානව සම්පත් පැතිකඩ** | |
| 6.1 කාර්ය මණ්ඩල සංඛ්‍යා කළමනාකරණය | 36 |
| 6.2 මානව සම්පත් හිඟය හෝ අතිරික්තය ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි සිදු කරන බලපෑම | 36 |
| 6.3 මානව සම්පත් සංවර්ධනය | 36 |
| **7 අනුකූලතා වාර්තාව** | 38-46 |

# 1. ආයතනික පැතිකඩ

## 1.1 හැඳින්වීම

2024 ජූනි මස 18 වෙනි දින සම්මත කර 2024 නොවැම්බර් මස 25 දින සිට බලාත්මක වූ 2024 අංක 33 දරණ රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය ස්ථාපිත කරන ලද අතර 2024 දෙසැම්බර් මස 02 දින එහි මෙහෙයුම් අරඹන ලදි. මෙහෙයුම්මය වශයෙන් ස්වාධීන රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා නෛතික රාමුව රාජ්‍ය ණය කළමනාකරණ පනත මගින් සැළසේ. රටේ දිගු කාලීන මූල්‍ය සෞඛ්‍යය හා ණය තිරසාරබව සඳහා අත්‍යාවශ්‍ය වන්නාවූ රාජ්‍ය ණය කළමනාකරණය කිරීම ශක්තිමත් කිරීම හා මධ්‍යගත කිරීම, රාජ්‍ය ණය සම්බන්ධ තොරතුරු බෙදා හැරීමෙන් වගවීම සහ ණයෙහි විනිවිදබව වැඩි දියුණු කිරීම, ණය ගැනීමේ කටයුතු කාර්යක්ෂමව හා විනිවිදබවින් යුක්තව ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයෙන් සිදුවේ.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු සහ ඉලක්ක

### දැක්ම

" විශ්වාසනීයත්වය, කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය සඳහා පිළිගත්, ගෝලීය තලයේ රාජ්‍ය ණය කළමනාකරණය සඳහා ආදර්ශයක් වීම.”

### මෙහෙවර

“රජයේ ණය ගැනීමේ අවශ්‍යතා උපායමාර්ගිකව ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම, මූල්‍යකරණ පිරිවැය අවම කිරීම සහ ශ්‍රී ලංකාවේ ආර්ථික හා මූල්‍ය අරමුණු සමඟ සමපාත වන පරිදි විචක්ෂණශීලී අවදානම් මට්ටමක් සහතික කිරීම.’’

### අරමුණු

- කාලෝචිත පදනමක් මත මූල්‍යකරණ අවශ්‍යතා සහ ණය ගෙවීමේ බැඳීම් සපුරාලීම.
- විචක්ෂණශීලී අවදානම් මට්ටමට අනුකූලව මධ්‍ය කාලීන සිට දිගු කාලීනව හැකි තරම් අඩු පිරිවැයකින් ණයට ගැනීම.
- දේශීය ණය සුරැකුම්පත් වෙළඳපොළ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම

## 1.3 ප්‍රධාන කාර්යයන්

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය "ඉදිරි කාර්යාලය", "මධ්‍යම කාර්යාලය" සහ "පසුපස කාර්යාලය"ලෙස අත්‍යාවශ්‍ය අංශ තුනකින් සමන්විත වේ. මෙම එක් එක් අංශයේ ප්‍රධානත්වය අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයකු විසින් උසුලනු ලබයි.

### 1.3.1 ඉදිරි කාර්යාලය (Front Office)

රජයේ ණය ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සහ අනුමත ණය කළමනාකරණ ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාථමික වගකීම සමඟින් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ මෙහෙයුම් හස්තය ලෙස ඉදිරි කාර්යාලය කටයුතු කරයි. එමගින් දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් මූල්‍යනය කිරීමේත්, ආයෝජකයින් හා සංවර්ධන පාර්ශවකරුවන් සමඟ ඵලදායී ලෙස නියැලීම පවත්වා ගෙන යාමේත්, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපළේ සංවර්ධනයට සහායවීමේත් වගකීම දරනු ලැබේ. ණය ගැනීමේ මෙහෙයුම්, ආයෝජක සබඳතා සහ වෙළඳපල සංවර්ධන ඇරඹුම් ක්‍රියාත්මක කිරීම මඟින් කාර්යයක්ෂම ණය කලමනාකරණයටත්, තිරසාර වෙළඳපල ප්‍රවේශයටත් දායක වෙමින් ඉදිරි කාර්යාලය රජයේ මූල්‍යන අවශ්‍යතා සඳහා සහාය වේ.

එකිනෙකට ආවේණිකවූත්, අනුපූරකවූත් වගකීම් දරනු ලබන ප්‍රධාන ඒකක තුනකින් ඉදිරි කාර්යාලය සමන්විතවේ.

I. දේශීය ණය ගැනීමේ ඒකකය (DBU)
II. විදේශීය ණය ගැනීමේ ඒකකය (EBU)
III. ආයෝජක සබඳතා සහ වෙළඳපොළ සංවර්ධන ඒකකය (IRU)

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය ස්ථාපිත කිරීමේ සිට, ඉදිරි කාර්යාලය විසින් රජයේ දේශීය හා විදේශීය ණය ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේත්, ආයෝජක සබඳතා ශක්තිමත් කිරීමේත්, රජයේ සුරැකුම්පත් වෙළඳපල සංවර්ධනය කිරීම සඳහා සහාය දීමේත් තීරණාත්මක භූමිකාව දරා ඇත. එක් එක් ඒකකයේ ප්‍රධාන කාර්යයන් පහත සඳහන් වේ.

#### 1.3.1.1 දේශීය ණය ගැනීමේ ඒකකය (DBU)

රජයේ මූල්‍යන අවශ්‍යතා සපුරා ගැනීමෙහිලා දේශීය අරමුදල් සපයා ගැනීමේදීත්, වාර්ෂික ණය ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙහිදීත් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ දේශීය ණය ගැනීමේ ඒකකය - ඉදිරි කාර්යාලය විසින් කේන්ද්‍රීය භූමිකාව දරනු ලැබේ. රජයේ මූල්‍යන උපාය මාර්ගයන්ට අනුකූලව, දේශීය ණය ගැනීමේ මෙහෙයුම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම මගින් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හා අනෙකුත් ණය උපකරණ නිකුත් කිරීම සඳහා මෙම ඒකකය වගකීම් දරනු ලැබේ. මීට අමතරව දේශීය ණය ගැනීමේ ඒකකය ස්වෛරී සුරැකුම්පත් සැකසීම හා ණය ලබාදීමේ පහසුකම් සඳහා වගකීම දරනු ලැබේ.

- රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් රජයේ සුරැකුම්පත් නිකුත් කිරීමේ සංක්‍රාන්තිය සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව / ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සම්බන්ධ වී 2025 වර්ෂ අවසානයට පෙර එවැනි නිකුත් කිරීම් සිදු කිරීම සඳහා සේවාස්ථ පුහුණුවට සහභාගී වීම.
- කාර්තුමය ණය ගැනීම් තීරණය කිරීම සඳහා ණය සහ මුදල් කළමනාකරණ කමිටු (DCMC) රැස්වීම් සඳහා පහසුකම් සැලසීම සහ පැවැත්වීම.
- (මාසිකව සිදු වන යාවත්කාලීන කිරීම් සමඟ කාර්තුමය වශයෙන්) භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ දින දර්ශන ප්‍රකාශයට පත් කිරීම
- ඉල්ලුම සහ අභිමතයන් ඇගයීම සඳහා වෙළඳපොළ සහභාගිවන්නන් සමඟ පූර්ව ලංසු රැස්වීම් පැවැත්වීම.
- රජයේ සුරැකුම්පත් සඳහා වෙන්දේසි පැවැත්වීම : භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ දේශීය ඩොලර් බැඳුම්කර.

- පුවත්පත්වල සහ මුදල් අමාත්‍යාංශ හා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාල වෙබ් අඩවිවල වෙන්දේසි නිවේදන පළ කිරීම.
- වෙන්දේසියේදී තීරණ ගනු ලැබීම සඳහා තාක්ෂණික ඇගයුම් කමිටුවේ නිර්දේශ වෙන්දේසි මෙහෙයුම් කමිටුවට (ASC) ඉදිරිපත් කිරීම.
- වෙන්දේසි ප්‍රතිඵල මුදල් අමාත්‍යාංශ සහ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාල වෙබ් අඩවිවල පළ කිරීම.
- බ්ලූම්බර්ග් පද්ධතිය භාවිතයෙන් ද්විතියික වෙළඳපොළ වාර්තා සැකසීම.
- උප ණය දීම, ඇපකර, වෙළඳපොළ නොවන ණය ගැනීම් සිදු කිරීමට භාර ගැනීම.
- වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම සකස් කිරීමට දායකවීම.

### 1.3.1.2 විදේශීය ණය ගැනීමේ ඒකකය (EBU)

රජයේ විදේශීය මූල්‍යකරණ මෙහෙයුම් කළමනාකරණය කිරීම සහ විදේශීය මූල්‍යන උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම සඳහා විදේශීය ණය ගැනීමේ ඒකකය (EBU) කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කරයි. ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සංවර්ධන හවුල්කරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා මෙහෙයවීම, මූල්‍යකරණ යෝජනා ඇගයීම සහ විදේශීය මූල්‍යකරණ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා මෙම ඒකකය වගකීම දරයි. මෙම වගකීම් ඉටු කිරීමේදී, ණය තිරසාරභාවය, මූල්‍යකරණ පිරිවැය සහ ඒ ආශ්‍රිත අවදානම් පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමින් ණය ගැනීමේ තීරණ පිළිබඳ උපායමාර්ගික උපදෙස් විදේශීය ණය ගැනීමේ ඒකකය විසින් සපයනු ලබන අතර එමඟින් තිරසාර හා විචක්ෂණශීලී ආකාරයකින් මූල්‍යකරණ අවශ්‍යතා සපුරාලීම සඳහා රජය දරන උත්සාහයන්ට සහාය වේ.

විදේශීය ණය ගැනීමේ ඒකකයෙහි ප්‍රධාන කාර්යයන් අතරට පහත සඳහන් දෑ ඇතුළත් වේ. :

I. රාජ්‍ය ණය කළමණාකරණ පනතෙහි (PDMA) හි අරමුණු සමඟ පෙළගැස්වීම සහතික කිරීම සඳහා නියෝජිතායතනවල මූල්‍යකරණ නියමයන් සහ කොන්දේසි සමාලෝචනය කිරීම සහ නියෝජිතායතන සමඟ මූල්‍ය නියමයන් සහ කොන්දේසි සාකච්ඡා කිරීම ඇතුළුව ද්විපාර්ශ්වික, බහුපාර්ශ්වික සහ වාණිජ ප්‍රභවයන්ගෙන් සියලුම රජයේ විදේශීය මූල්‍යනයන් සාකච්ඡා කිරීම, කොන්ත්‍රාත්කරණය සහ කළමනාකරණය කිරීම සහ රාජ්‍ය ණය කළමනාකරණ පනතේ විධිවිධාන යටතේ ගරු අමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

II. වගකීම් කළමනාකරණය ආශ්‍රිත ක්‍රියාකාරකම්.

III. රාජ්‍ය ව්‍යවසායන් සඳහා උප ණය ලබා දීම සඳහා ගිවිසුම් සහ ඇපකර ගිවිසුම් ක්‍රියාත්මක කිරීම (රාජ්‍ය ණය ගැනීම් වලට අදාළව) යනාදිය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම ඇතුළුව ණය දීම සහ සුරැකුම් කරන ලද ණය.

IV. රටේ බහුපාර්ශ්වීය පරිත්‍යාගශීලී නියෝජිතායතනවල උපාය මාර්ග සාකච්ඡාවන්ට සහභාගී වීම, ධූත සම්බන්ධීකරණය කිරීම, ආයෝජන කළඹ සමාලෝචනය කිරීම තුළින් සහභාගී වීමෙන් ජාත්‍යන්තර සහයෝගීතාව සහ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය සහතික කිරීම.

V. මධ්‍යම කාර්යාලය සමඟ සම්බන්ධීකරණය කිරීමේදී ණය ගැනීමේ සීමාවන් අධීක්ෂණය කිරීම.

VI. ගෝලීය මූල්‍ය තත්ත්වයන්, පොලී අනුපාත ප්‍රවණතා සහ මුදල් චලනයන් නිරීක්ෂණය කිරීමෙන් ප්‍රවණතා විශ්ලේෂණය තුළින් අනාගත විදේශීය ණය ගැනීමේ උපාය මාර්ග සඳහා ගම්‍යාර්ථයන් ඇගයීමෙන් ප්‍රවණතා විශ්ලේෂණය.

**1.3.1.3 ආයෝජක සබඳතා සහ වෙළඳපොළ සංවර්ධන ඒකකය** (IRU)

රජයේ ආයෝජක සබඳතා රාමුව ශක්තිමත් කිරිම සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොළ සංවර්ධනයට සහාය වීම සඳහා ආයෝජක සබඳතා සහ වෙළඳපොළ සංවර්ධන ඒකකය කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කරයි. ආයෝජක සබඳතා ක්‍රමෝපායන් සැකසීම හා ක්‍රියාත්මක කිරීම, ආයෝජකයන් හා අනෙකුත් ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ ක්‍රියාකාරී ලෙස කටයුතු කිරීම අඛණ්ඩව සිදු කිරීම සහ ආයෝජක පදනම පුළුල් කිරීමේ ඇරඹුම සඳහා පහසුකම් සැලසීම හා දේශීය රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපල වැඩි දියුණු කිරීම සඳහා මෙම ඒකකය වග කියනු ලැබේ. මෙම වගකීම් ඉටු කිරීමේදී ආයෝජක විශ්වාසය වැඩි දියුණු කරමින්, පාර්ශ්වකරුවන් හා සම්බන්ධීකරණය සවිමත් කරමින්, සඵලදායී ආයෝජක සබඳතා ප්‍රවර්ධනය කරමින් හා වෙළඳපල සංවර්ධන කටයුතු කරමින් රජයේ මූල්‍යන අරමුණු සඳහා ආයෝජක සබඳතා සහ වෙළඳපොළ සංවර්ධන ඒකකය විසින් සහාය ලබා දෙනු ලැබේ.

ආයෝජක සබඳතා සහ වෙළඳපොළ සංවර්ධන ඒකකයේ ප්‍රධාන කාර්යයන්ට පහත සඳහන් කරුණු ද ඇතුලත්වේ. :

- අනාවරණය කිරීමේ මාර්ග, ඉලක්කගත ප්‍රේක්ෂකයින් සහ රජය තුළ සම්බන්ධීකරණය කිරීම පිළිබඳ සලකා බලමින් රාජ්‍ය ණය සම්බන්ධ තොරතුරු සහ ආයෝජක සබඳතා ක්‍රියාකාරකම් ප්‍රකාශයට පත් කිරීම සඳහා උපාය මාර්ගයක් නිර්වචනය කිරීම.
- වාර්ෂික ආයෝජක සබඳතා සැලැස්ම සකස් කිරීම.
- රජයේ ණය සුරැකුම්පත් (දේශීය සහ විදේශීය), ණයහිමියන්, මූල්‍ය අතරමැදියන්, ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතන සහ ණය පර්යේෂණ විශ්ලේෂකයින් සමඟ ක්‍රියාකාරීවූත්, ක්‍රමිකවූත් සම්බන්ධතා ඇති කරගෙන පවත්වා ගෙන යාම සහ ආර්ථික හා මූල්‍ය තත්ත්වය, රටේ ඉදිරි දර්ශන සහ රාජ්‍ය ණය පිළිබඳ සම්පූර්ණවූත්, කාලීනවූත් තොරතුරු සැපයීම සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම.
- දේශීය ණය සුරැකුම්පත් වෙළඳපොළ සහ මූල්‍යකරණ වෙළඳපොළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා මහ බැංකුව, සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාව වැනි විවිධ රාජ්‍ය නියෝජිතායතන සහ වෙළඳපොළ සහභාගිවන්නන්, අනෙකුත් නියාමන ආයතන සමඟ පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධීකරණය සඳහා පහසුකම් සැලසීම.
- ඵලදායී ආයෝජක සබඳතා භාවිතයන් වැඩි දියුණු කිරීම සහ ආයෝජක පදනම විවිධාංගීකරණය කිරීම.
- වෙළඳපල තත්ත්වයන් සහ අවශ්‍යතා පදනම් කරගනිමින්, නව රජයේ ණය සුරැකුම්පත් හඳුන්වා දීම සඳහා සුදුසු වෙළඳපල තත්ත්වයන් ගවේෂණය කිරීම.
- රජයේ ණය සඳහා ආයෝජක පදනම විශ්ලේෂණය කිරීම ඇතුළුව දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තත්ත්වයන් සහ සහභාගිවන්නන් අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම.
- ආයෝජක සබඳතා සහ සන්නිවේදනය කළමනාකරණය කිරීම.

### 1.3.2 මධ්‍යම කාර්යාලය (Middle Office)

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ (PDMO) විශ්ලේෂණාත්මක සහ උපායමාර්ගික අංශය ලෙස මධ්‍යම කාර්යාලය ක්‍රියාත්මක වන අතර, රජයේ ණය ආයෝජක කළඹ ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ මූලික වගකීම දරයි. එය වෙළඳපල තත්ත්වයන් අඛණ්ඩව තක්සේරු කිරීම, ආශ්‍රිත අවදානම් පිළිබඳ විස්තීර්ණ ඇගයීම සහ ඉදිරි කාර්යාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය ගැනීමේ කටයුතු මෙහෙයවීම සඳහා ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීම ඇතුළත් පෙර දැක්මක් සහිත සහ අවදානම් දැනුවත් ප්‍රවේශයක් අනුගමනය කරයි. දැඩි විශ්ලේෂණාත්මක රාමු සහ ව්‍යුහගත උපායමාර්ගික සැලසුම්කරණය මඟින්, මධ්‍යම කාර්යාලයේ විචක්ෂණශීලී අවදානම් මට්ටම් පවත්වා ගනිමින්, සමස්ත ණය තිරසාර බවට සහාය වෙමින් මූල්‍යකරණය පිරිවැය - ඵලදායී අයුරකින් සුරක්ෂිත කර ඇති බව සහතික කරයි.

මධ්‍යම කාර්යාලය ප්‍රධාන ඒකක තුනකින් සමන්විත වන අතර, ඒ සෑම එකක්ම එකිනෙකට වෙනස වූ ආවේණික වගකීම් දරයි.

I. ප්‍රතිපත්ති විශ්ලේෂණ ඒකකය (PAU)
II. ණය අවදානම් විශ්ලේෂණ සහ අධීක්ෂණ ඒකකය (CRAMU)
III. අවදානම් පාලන සහ අනුකූලතා ඒකකය (RCU)

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය ස්ථාපනය කිරීමෙන් පසු, මධ්‍යම කාර්යාලය 2025 දී නව්‍ය, තාර්කික සහ තිරසාර ණය කළමනාකරණ පිළිවෙත් හඳුන්වා දීමෙන් ශක්තිමත් කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත. මෙම උත්සාහයන්, ජාත්‍යන්තර යහ පිළිවෙත් සමඟ පෙළගැසෙන අතරම නෛතික අවශ්‍යතාවන්ට අනුකූල වීම සහතික කරමින් රටේ ණය කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීමට දායක වී ඇත.

#### 1.3.2.1 ප්‍රතිපත්ති විශ්ලේෂණ ඒකකය (PAU)

ප්‍රතිපත්ති විශ්ලේෂණ ඒකකය (PAU) ශ්‍රී ලංකාවේ මුදල් අමාත්‍යාංශයේ (MoF) රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය (PDMO) තුළ මධ්‍යම කාර්යාල (MO) උපායමාර්ගික අංශය ලෙස කටයුතු කරයි. 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත සහ 2025 ජූලි 09 වන දින මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ මාර්ගෝපදේශ මගින් ස්ථාපනය කරන ලද විධිවිධාන යටතේ ප්‍රතිපත්ති සහ විශ්ලේෂණ ඒකකය ක්‍රියාත්මක වේ.

**ප්‍රතිපත්ති සහ විශ්ලේෂණ ඒකකයෙහි මූලික කාර්යභාරය වන්නේ :**

- මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය සකස් කිරීම
- වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම සකස් කිරීම
- මූල්‍ය අවදානම් කළමනාකරණ මාර්ගෝපදේශ සකස් කිරීම සහ මනා අයුරින් මූල්‍ය සහ ණය කළමනාකරණ තීරණ ගැනීමේදී සහාය වීම සඳහා උසස් තත්ත්වයේ විශ්ලේෂණ වාර්තා සකස් කිරීම
- උපායමාර්ගික ඉලක්කවලට අනුකූලව විචක්ෂණශීලී අවදානම් මට්ටම් පවත්වා ගනිමින්, රජයේ මූල්‍යකරණ අවශ්‍යතා හැකි අවම පිරිවැයකින් සපුරාලීම සහතික කිරීම.

**1.3.2.2.** **ණය අවදානම් විශ්ලේෂණ සහ අධීක්ෂණ ඒකකය** (CRAMU)

ණය අවදානම් විශ්ලේෂණ සහ අධීක්ෂණ ඒකකය (CRAMU) විසින් පහත සඳහන් ප්‍රධාන කාර්ය භාරයන් ඉටු කරනු ලැබේ.

- රාජ්‍ය ව්‍යවසායයන් (SOEs), පළාත් සභා, පළාත් පාලන ආයතන හා පනතේ නිර්වචනය කර ඇති අනෙකුත් ආයතන සම්බන්ධයෙන් ලබාදෙන ණය ඇපකර සහ උප ණය ලබා දීමේ විධිවිධාන වලින් පැන නගිනන්නාවූ ණය අවධානම ඇගයීම සහ අධීක්ෂණය කිරීම
- ණය ඇපකර සහ උප ණය දීමේ කටයුතු අනුමත කිරීම සහ නිකුත් කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවක් ලෙස ණය අවදානම් තක්සේරුව සිදු කිරීම
- ණය ඇපකර සහ උප ණය දීමේ කාලය තුළ නියමිත කාල පරාසයන්හි ඇගයීම සිදු කර ණය ඇපකර සහ උප ණය කළඹෙහි ණයෙහි ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම

1.3.2.3. **අවදානම් පාලන සහ අනුකූලතා ඒකකය** (RCU)

- මූල්‍ය අවදානම් අධීක්ෂණය සහ අනුකූලතාව**,** මෙහෙයුම් අවදානම් කළමනාකරණය**,** අභ්‍යන්තර හා බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධීකරණය කිරීම, සහ අනුකූලතාව සහ අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ අවදානම් පාලන සහ අනුකූලතා ඒකකය (RCU) ස්ථාපනය කර ඇත.
- අවංකභාවයෙන් කටයුතු කිරීමේ සංස්කෘතිය**,** ඉහළ ආචාර ධර්ම ප්‍රමිතීන් සහ ශක්තිමත් අවදානම් දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම,

1.3.3 **පසුපස කාර්යාලය** (Back Office)

කාලීන පදනමින් ණය සේවා ගෙවීමට ඇති බැඳීම් සපුරාලීම, රාජ්‍ය ණය, ණය සුරැකුම්පත්, ණය ලබා දීම, සැපයුම්කරුවන්ගේ ණය සහ මූල්‍ය බද්ද සටහන් කර ගැනීම, වාර්තාකරණය, බෙදා හැරීම සහ ප්‍රකාශ කිරීමේ ඉලක්කය පසුපස කාර්යාලය මගින් සිදු කරයි.

පසුපස කාර්යාලය ප්‍රධාන ඒකක තුනකින් සමන්විත වන අතර**,** ඒ සෑම එකක්ම එකිනෙක හා සම්බන්ධ වූ විවිධ වගකීම් දරයි.

**I.** ණය වාර්තා කිරීමේ ඒකකය (DRU)
**II.** ණය සේවාකරණ ඒකකය (DSU)
**III.** ණය සංඛ්‍යාලේඛන සහ වාර්තාකරණ ඒකකය (DS & RU)

2025 වසරේදී රාජ්‍ය ණය සේවාකරණයේදී, රාජ්‍ය ණය සංඛ්‍යාලේඛන සටහන් කිරීමේදී, පොදු රාජ්‍ය මණ්ඩලීය ඉහළ ණය සටහන් කිරීමේ පද්ධතියට සංක්‍රමණය කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටීමේදී සහ රාජ්‍ය ණය විනිවිද යාම වැඩි කරමින් රාජ්‍ය ණය දත්ත බෙදා හැරීමේදී පසුපස කාර්යාලය වැදගත් භූමිකාවක නිරතව සිට ඇත. මෙම එක් එක් ඒකකයේ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

**1.3.3.1** ණය වාර්තා කිරීමේ ඒකකය (DRU)

රජයේ ණය ආයෝජක කළඹ සටහන් කිරීම, පවත්වාගෙන යාම සහ අධීක්ෂණය කිරීම සඳහා ණය වාර්තා කිරීමේ ඒකකය ප්‍රධාන ලක්ෂය ලෙස ක්‍රියා කරයි. දේශීය සහ විදේශීය ණය ලබා ගැනීම්, ණය සේවාකරණය සුරැකුම්පත් සහ ණය ගැනීමේ ගනුදෙනු සම්බන්ධ නිරවද්‍යතාව, පරිපූර්ණබව සහ කාලීනබව සහතික කිරීම සඳහා මෙම ඒකකය වග කියනු ලැබේ.

ණය වාර්තා කිරීමේ ඒකකය වර්තමානයේදී පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාල ණය සටහන් කිරීම සහ කළමනාකරණ පද්ධතිය පරිපාලනය කිරීම සහ ව්‍යාපාර ක්‍රියාවලීන් ප්‍රධාන ණය කළමනාකරණ පද්ධතිය සඳහා මෙහෙයුම් කටයුතු සහ ණය සටහන් සංක්‍රමණය කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. එම ඒකකය අදාළ පාර්ශ්වකරුවන් සමඟ ණය ගනුදෙනු සංසන්දනය කිරීම, විශ්වාසදායී ණය තොරතුරු සහ වාර්තා සැකසීම, අදාළ නීති, ප්‍රතිපත්ති සහ වාර්තාකරණ අවශ්‍යතාවන්ට අනුකූලත්වය සහතික කිරීම සිදු කරයි. මෙම වගකීම් ඉටු කිරීමේදී දන්වන ලද තීරණ ගැනීමට සහාය පළ කිරීම සඳහා නිරවද්‍ය, කාලීන ණය තොරතුරු ලබා දීම, ණය තිරසාරබව විශ්ලේෂණය, සහ සඵලදායී ණය ආයෝජක කළඹ කළමනාකරණය කිරීම ණය වාර්තා කිරීමේ ඒකකයෙන් සිදු කරනු ලැබේ.

ණය වාර්තා කිරීමේ ඒකකයේ ප්‍රධාන කාර්යයන්ට පහත සඳහන් දෑ ඇතුලත්වේ. :

- දේශීය හා විදේශීය ණය ගැනීම්, ණය සේවාකරණය, වියපැහැදම් ගෙවීම්, ණය සුරැකුම්පත් සහ ණය ලබා දීමේ සැළසුම් සහ ඉහළ ණය කළමනාකරණ පද්ධතිය වෙතට ණය වාර්තා සංක්‍රමණය කිරීම සඳහා පහසුකම් සළසමින් පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ දත්ත සටහන් කිරීමේ සහ කළමනාකරණ පද්ධතියේ (CS-DRMS) රාජ්‍ය ව්‍යවසායකත්ව, පළාත් සභා, පළාත් පාලන ආයතනවල සුරැකුම් නොකරන ලද ණය ඇතුළුව සියලුම රාජ්‍ය ණය ගිවිස්නා සහ ණය ගනුදෙනු පිළිබඳ වාර්තා නිවැරදිව, යාවත්කාලීන අයුරින් සටහන් කිරීම, පවත්වා ගෙන යාම සහ අධීක්ෂණය කිරීම.
- ප්‍රධාන ණය කළමනාකරණ පද්ධතිය වෙත සංක්‍රමණය කිරීමට සහාය ලබාදෙමින්, ඉදිරි කාර්යාලය විසින් බලය ලබා දෙන ලද්දාවූ ණය ගිවිස්නාවන්ගේ නියමයන් සහ කොන්දේසි වලංගු කිරීම සහ ණය, බැඳුම්කර, බිල්පත්, සුරැකුම්පත් සහ ඒ ආශ්‍රිත ගනුදෙනු පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ දත්ත සටහන් කිරීමේ සහ කළමනාකරණ පද්ධතියෙහි නිවැරදිව සටහන් කර ඇති බවට සහතිකවීම.
- ඉදිරි කාර්යාලය, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ණය ලබා දෙන්නන්, ප්‍රතිලාභීන්, රේඛීය අමාත්‍යාංශ, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණයේදී, ණය විය පැහැදම්, ණය සේවා ගෙවීම්, සහ වෙනත් ණය ගනුදෙනු සටහන් කිරීම සහ සැසඳීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ප්‍රකාශයට පත් කරන ලද විනිමය අනුපාතයන් භාවිත කරමින්, විදේශ විනිමය විය පැහැදම් ගෙවීම්වලට, ප්‍රාග්ධනීකරණය කරන ලද පොලියට සහ ණය සේවා ගෙවීම්වලට අනුරූප රුපියල් හා සමාන මුදල් ගණනය කිරීම සහ සටහන් කිරීම.
- ණය දත්තයන්ගේ නිරවද්‍යතාව සහ ඒකීයත්වය සනාථ කිරීම සඳහා ණය ගැනුම්කරුවන්, මූල්‍යන ආයතන, රජයේ නියෝජිතායතන සහ වෙනත් පාර්ශ්වයන් සමඟ ණය ගනුදෙනු සහ හිඟ ශේෂයන් අධීක්ෂණය කිරීම සහ සැසඳීම.
- රජයේ සුරැකුම්පත් සහ රජයට ලැබිය යුතු දෑ හා සම්බන්ධ වාර්තා කළමනාකරණය කිරීම සහ සහතික කරන ලද ණය කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.
- පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ දත්ත සටහන් කිරීමේ සහ කළමනාකරණ පද්ධතිය පරිපාලනය, ක්‍රියාත්මක කිරීමට අනුබල දීම සහ සුවපහසු සංක්‍රමණයක් සහතික කිරීම සඳහා දත්ත සංක්‍රමණය, පද්ධති වින්‍යාස කිරීම, පරිශීලක ප්‍රවේශ කළමනාකරණය, දත්ත වලංගු කිරීම, පරීක්ෂාව, ආරක්ෂාව, අනු පිටපත්, ආපදා ප්‍රතිසාධනය, ව්‍යාපාර අඛණ්ඩත්වය සහ පරිශීලක පුහුණුව ඇතුළුව ප්‍රධාන ණය කළමනාකරණ පද්ධතිය වෙත සංක්‍රමණය කිරීම
- ප්‍රතිපත්ති විශ්ලේෂණය, තීරණ ගැනීම සහ ව්‍යවස්ථාපිත වාර්තාකරණ අවශ්‍යතාවන්ට සහයෝගය දීම සඳහා ණය තොග, ණය සේවා, සුරැකුම්පත්, විය පැහැදම් ඇතුළුව කාලීනවූත්, නිරවද්‍යවූත් ණය වාර්තා, සංඛ්‍යාලේඛන තොරතුරු, සහ ණය දර්ශක ණය ආයෝජක කළඹ දත්ත සැකසීම සහ බෙදා හැරීම.
- අදාළ වන නෛතික සහ නියාමන අවශ්‍යතාවන්ට අනුව විද්‍යුත් සහ භෞතික ආකෘතිවලින් ණය ගිවිසුම්, සුරැකුම්පත් ගිවිසුම්, ලිපි, ණය ලබා දෙන්නන්ගේ ප්‍රකාශ, විය පැහැදම් නිවේදන, සහ වෙනත් සටහන් ඇතුළුව ණය හා සම්බන්ධ ලිපිලේඛනගත කිරීම් නඩත්තු කිරීම.

- සඵලදායී ක්‍රියාත්මක කිරීමට හා අනුකූලතාවට පහසුකම් සැපයීම සඳහා ණය ගිවිසුම්වල සටහන් කිරීමේ අවශ්‍යතා, ගෙවීම් සැලසුම්, වාර්තාකරණ බැඳීම් සහ මෙහෙයුම් කරුණු පිළිබඳ උපදෙස් දීමෙන්, ණය සාකච්ඡාවලදී මෙහෙයුම්මය යෙදවුම් සැපයීම සහ ණය කළමනාකරණ කටයුතු සඳහා සහාය ලබාදීම

- ව්‍යුහගත ගිවිසුම් ප්‍රකාරව ව්‍යුහගත ණය ක්‍රමක්ෂය කිරීමේ උපලේඛන සත්‍යාපනය, සංසන්දනය සහ සම්පූර්ණ කිරීමේදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ණය ලබාදෙන්නන් සහ වෙනත් අදාළ පාර්ශ්වයන් සමග සම්බන්ධීකරණයෙන් රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සහායවීම, ණය කළමනාකරණ පද්ධතියේ සංශෝධිත ණය කාලසීමා යාවත්කාලීන කිරීම, නිරවද්‍ය ණය සේවාකරණ සහ වාර්තා කිරීම සහතික කිරීම

1.3.3.2 **ණය සේවාකරණ ඒකකය** (DSU)

**2024** අංක **33** දරන ශ්‍රී ලංකා රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ ණය සේවාකරණය**,** අලුතින්ම ස්ථාපනය කරන ලද රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය (PDMO) හරහා මධ්‍යගත කර ඇති අතර**,** එමගින් බැඳීම් කාලෝචිත ලෙස ආපසු ගෙවීම සහතික කිරීම**,** ණය ගැනීමේ පිරිවැය අවම කිරීම**,** සහ රජයේ ණය මෙහෙයුම්වල විනිවිදභාවය පවත්වා ගෙන යාම සහතික කෙරේ. මීට පෙර මෙම කාර්යය ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව (PDD) විසින් සිදු කරන ලද අතර**,** 2025 ඔක්තෝබර් 13 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ ඔවුන්ගේ පරිශ්‍රයේදී ශ්‍රී ලංකා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය ණය සේවාකරණ කටයුතු ආරම්භ කරන ලදි. රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය තුළ ඇති පසුපස කාර්යාලයේ (BO) ණය සේවාකරණ ඒකකය (DSU)**,** 2025 දෙසැම්බර් මාසයේ සිට රජයේ සියලුම ණය බැඳීම් නිවැරදිව හා නියමිත වේලාවට ගෙවන බව සහතික කිරීම සඳහා වගකිව යුතු මෙහෙයුම් ඒකකය ලෙස කටයුතු කරයි.

**ණය සේවාකරණ ගනුදෙනු ආරම්භ කිරීම**

- ඉදිරි ණය සේවාකරණ ප්‍රමාණයන් අධීක්ෂණය කිරීම (දෛනිකව / සතිපතා / මාසිකව / වාර්ෂිකව).

- මූලික සහ පොලී ගෙවීම් සහ අදාළ ගාස්තු (එනම්, කැපවීමේ ගාස්තුව, පරිපාලන ගාස්තු, කළමනාකරණ ගාස්තු, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා නියෝජිත ගාස්තු, ජාත්‍යන්තර රාජ්‍ය බැඳුම්කර සඳහා වාර්ෂික පරිපාලන ගාස්තු ආදිය) ඇතුළුව දේශීය සහ විදේශීය ණය සඳහා ගෙවීම් උපදෙස් සැකසීම, පාලනය කිරීම සහ නිකුත් කිරීම.

- ණය සේවාකරණ ක්‍රියාවලිය ආරම්භ කර පොලී ගෙවීම්, අනෙකුත් ගාස්තු, (ඇත්නම්) ව්‍යුත්පන්න කොන්ත්‍රාත්තු යටතේ ගෙවීම් සහ අදාළ නියමිත දිනවලදී ප්‍රධාන ආපසු ගෙවීම් ඇතුළුව සියලුම බැඳීම් කාලීන ලෙස පියවීම සහතික කිරීම.

- එක් එක් ණය සේවා ගෙවීමක් සඳහාම, අදාළ පාර්ශ්වයන් (ශ්‍රී ලංකා මහ බැංකුව සහ SAD) වෙත ගෙවීම් උපදෙස් සන්නිවේදනය කර භාර දීම සහ අදාළ පද්ධති සමග අවශ්‍ය දත්ත බෙදා ගැනීම සිදු කිරීම.

- සුරැකුම් කරන ලද ණය ලෙස හැඳින්වෙන කාලෝචිත හා නිවැරදි ණය සේවාකරණය සහතික කිරීම.

- ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සම්බන්ධීකරණයෙන් අදාළ භාණ්ඩාගාර බැංකු ගිණුම් ශේෂයන් අධීක්ෂණය කිරීම.

- ගෙවීම් ණය කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි නිසි ලෙස සටහන් කර ඇති බවට සහතික වීම.

**විසර්ජන සහ ණය සේවා පුරෝකථනය**

- රාජ්‍ය ණය සහ සුරැකුම් කරන ලද ණය සඳහා විසර්ජන සහ ණය සේවාකරණ පුරෝකථනයන් සැකසීම, රාජ්‍ය ණයට ඇතුළත් කිරීම සඳහා ණය ලබා දීම.
- සෑම මසකම අවසානයේ, එකඟ වූ පරිදි, පෙරළෙන මාස දොළහක් හෝ වෙනත් ඕනෑම කාල පරිච්ඡේදයක් ආවරණය වන පරිදි, පවතින ණය සඳහා ණය ලබා දීමේ මෙහෙයුම් සහ රජයේ ණය සේවාකරණයේ ප්‍රක්ෂේපිත මුදල් ප්‍රවාහ සකස් කර, ඒවා ඉදිරි කාර්යාලය / මධ්‍යම කාර්යාලය සහ අදාළ ප්‍රතිපාර්ශ්වයන් (TOD, ශ්‍රී ලංකා මහ බැංකුව) වෙත යැවීම.

### **1.3.3.3 ණය සංඛ්‍යාලේඛන සහ වාර්තාකරණ ඒකකය**

ණය සංඛ්‍යාලේඛන සහ වාර්තාකරණ ඒකකය (DSRU) රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය (PDMO) තුළ ඇති පසුපස කාර්යාලයේ (BO) ප්‍රාථමික දත්ත ප්‍රගණන ඒකකය ලෙස කටයුතු කරයි. 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතට අනුව, දේශීය නෛතික අවශ්‍යතා සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව විස්තීර්ණ රාජ්‍ය ණය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීම, වාර්තා කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සඳහා ණය සංඛ්‍යාලේඛන සහ වාර්තාකරණ ඒකකය වග කියනු ලැබේ. ව්‍යුහගත වාර්තාකරණ රාමු මගින්, වාර්තාකරණයෙහි විනිවිදභාවය සහතික කරන අතර ජාතික ප්‍රතිපත්ති සම්පාදනය සහ ණය තිරසාරත්වය විශ්ලේෂණය සඳහා අවශ්‍ය අත්‍යවශ්‍ය සංඛ්‍යානමය පදනම සැපයේ.

ණය සංඛ්‍යාලේඛන සහ වාර්තාකරණ ඒකකයේ ප්‍රධාන කාර්යයන්ට පහත සඳහන් කරුණු ඇතුලත්වේ.

- නිල ප්‍රකාශන සහ වාර්තාකරණ ක්‍රමවේද මගින් ණය තොග, ණය සේවා සහ වෙනත් ණය හා සම්බන්ධ තොරතුරු ඇතුලත්ව **රාජ්‍ය ණය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීම, වාර්තා කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම**
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, අන්තර්ජාතික ණය පියවීම් සඳහා වන බැංකුව (BIS) සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දත්ත ඉදිරිපත් කිරීම ඇතුළුව **ජාත්‍යන්තර වාර්තාකරණ අවශ්‍යතාවන්ට අනුව ණය සංඛ්‍යාලේඛන සැකසීම සහ ඉදිරිපත් කිරීම**
- කාර්තුමය ණය සඟරාව, අර්ධ වාර්ෂික ණය වාර්තා සහ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ වාර්ෂික වාර්තා සහ වෙනත් ව්‍යවස්ථාපිත වාර්තා ඇතුලත්ව **රාජ්‍ය ණය කළමනාකරණ වාර්තා සහ ප්‍රකාශන සැකසීම සහ අදාළ තොරතුරු ලබා දීම.**
- දේශීය හා විදේශීය වාර්තාකරණ අවශ්‍යතා සඳහා **ණය හා සම්බන්ධ වාර්තා, සංඛ්‍යාලේඛනමය වගු, ඉදිරිපත් කිරීම් සහ අවශ්‍යතාව අනුව සකස් කරන ලද තොරතුරු ලබා දීම.**
- ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සංඛ්‍යාලේඛනමය ප්‍රමිතීන්ට හා ක්‍රමවේදයන්ට අනුව **ණය සංඛ්‍යාලේඛන ඒකරාශී කිරීම හා සම්පාදනය කිරීම.**

### 1.3.4 පරිපාලන හා මුදල් අංශය

මානව සම්පත්, වත්කම් සහ මූල්‍ය සම්පත් කළමනාකරණය කිරීම සඳහා පරිපාලන හා මුදල් අංශය වග කියනු ලැබේ. දෙපාර්තමේන්තුව තුළ නිලධාරීන් ස්ථානගත කිරීම, නිලධාරීන්ගේ හැකියා සංවර්ධනය සහ සුභසාධනය මානව සම්පත් කළමනාකරණයට ඇතුළත් වේ. භෞතික හා මූල්‍ය සම්පත් අත්පත් කර ගැනීම, නඩත්තු කිරීම සහ සටහන් පවත්වා ගෙන යාම, භෞතික හා මූල්‍ය සම්පත් කළමනාකරණය මගින් ආවරණය කෙරේ. ඊට අමතරව, වාර්ෂික වැඩ සැලැස්ම, කාර්ය සාධන වාර්තා, වාර්ෂික මුදල් වාර්තා සැකසීම සහ විගණන ගැටළු පිළිබඳ පසු විපරම් කිරීම ද පරිපාලන හා මුදල් අංශයේ විෂය පථය යටතට අයත්වේ.

## 1.4 2025 දෙසැම්බර් මස 31 දිනට සංවිධාන ව්‍යුහය



## 2. ප්‍රගතිය සහ අනාගත දැක්ම

### 2.1 ඉදිරි කාර්යාලය

### 2.1.1 දේශීය ණය ගැනීමේ ඒකකය

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය ස්ථාපනය කිරීමෙන් පසුව, රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙන් එම කාර්යාලය වෙත මාරු කරන ලදි. සුමට සංක්‍රමණයකට පහසුකම් සැළසීම සඳහා 2025 මාර්තු සිට නොවැම්බර් දක්වා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ නිලධාරීන් විසින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද ව්‍යුහගත සේවාස්ථ පුහුණුව ලබා ගන්නා ලදි. 2025 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දේශීය ණය ගැනීමේ ඒකකය ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය වෙන්දේසි පද්ධතිය භාවිතයෙන් රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීම ඇරඹීය.

*** 2025 දෙසැම්බර්හිදී කාර්යයන් බාර ගැනීමෙන් පසු ප්‍රගතිය ලබා දී ඇත.**

| | ඉලක්ක | දර්ශක | ප්‍රගතිය |
|---|---|---|---|
| 1 | රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම ආරම්භ කිරීම | දේශීය ණය ගැනීමේ ඒකකය / රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් රජයේ සුරැකුම්පත් නිකුත් කරනු ලැබේ. | 2025 දෙසැම්බර් මාසයේ සිට, දේශීය ණය ගැනීමේ ඒකකය / රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් රජයේ සුරැකුම්පත් නිකුත් කරන ලදි. |
| 2 | පූර්ව ලංසු රැස්වීම් පැවැත්වීම | පවත්වන ලද පූර්ව ලංසු රැස්වීම් ගණන | එක් රැස්වීමක් සාර්ථකව පවත්වන ලදී. |
| 3 | ණය සහ මුදල් කළමනාකරණ කමිටු (DCMC) පැවැත්වීම | පවත්වන ලද ණය සහ මුදල් කළමනාකරණ කමිටු රැස්වීම් ගණන | රැස්වීම් 4 ක් සාර්ථකව පවත්වන ලදී. |
| 4 | භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි පැවැත්වීම | පවත්වන ලද වෙන්දේසි ගණන<br><br>පිළිගත් ප්‍රමාණය | වෙන්දේසි 5 ක් සාර්ථකව පවත්වන ලදී.<br><br>රුපියල් බිලියන 286 |
| 5 | භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි පැවැත්වීම | පවත්වන ලද වෙන්දේසි ගණන<br><br>පිළිගත් ප්‍රමාණය | වෙන්දේසි 2ක් සාර්ථකව පවත්වන ලදී.<br><br>රුපියල් බිලියන 177 |
| 6 | දේශීය ඩොලර් බැඳුම්කර වෙන්දේසි පැවැත්වීම | පවත්වන ලද වෙන්දේසි ගණන<br><br>පිළිගත් ප්‍රමාණය | එක් වෙන්දේසියක් සාර්ථක ලෙස පවත්වන ලදි.<br><br>ඇමෙරිකානු ඩොලර් මිලියන 50 |

| | | | |
|---|---|---|---|
| 7 | බ්ලූම්බර්ග් වේදිකාව භාවිතයෙන් ද්විතීයික වෙළඳපල වාර්තා ප්‍රකාශයට පත් කිරීම | ප්‍රකාශයට පත් කරන ලද වාර්තා සංඛ්‍යාව | වාර්තා 21 ක් ප්‍රකාශයට පත් කරන ලදි. |
| 8 | උප ණය දීම, ඇපකර, වෙළඳපල නොවන ණය ගැනීම් සිදු කිරීම | උප ණය දීම, ඇපකර, වෙළඳපල නොවන ණය ගැනීම් සිදු කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ලද අවස්ථා සංඛ්‍යාව | අවස්ථා 4 ක කටයුතු සිදු කරන ලදි. |
| 9 | වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම සැකසීම සඳහා දායකවීම | ඉල්ලීම පරිදි විස්තර ලබා දීම | ලබා දෙන ලදි. |

### 2.1.2 විදේශීය ණය ගැනීමේ ඒකකය (EBU)

2025 වර්ෂය තුළදී ඇමෙරිකානු ඩොලර් මිලියන 1,238 ක නව විදේශීය මූල්‍යකරණ බැඳීම් ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් පහසුකම් සපයන ලදි. ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 790 ක්, ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ (IDA) ලෝක බැංකු සමූහයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 180 ක්, ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙන් (AIIB) ඇමරිකානු ඩොලර් මිලියන 52 ක් සහ සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදලෙන් ඇමරිකානු ඩොලර් මිලියන 10 කින් සමන්විත විය. ණය තිරසාරභාවය පිළිබඳ අරමුණු සහ ණය කළමනාකරණ රාමුව යටතේ ස්ථාපිත පිරිවැය - අවදානම් පරාමිතීන් සමඟ අනුකූලතාව පවත්වා ගනිමින් රජයේ මූල්‍යකරණ අවශ්‍යතාවන්ට සහාය වන කොන්දේසි මත මෙම මූල්‍යකරණ විධිවිධාන සුරක්ෂිත කරන ලදි. ආසියානු යටිතල පහසුකම්,(RFI) ආයෝජන බැංකුවෙන් (AIIB) ඇමරිකානු ඩොලර් මිලියන 52 ( රුපියල් බිලියන 15.7 කට සමාන) ක් වූ ණය ලංකා විදුලිබල මණ්ඩලයට උප ණය ලෙස ලබා දුන් අතර ඒ අනුව උප ණය ගිවිසුමක් 2025 දී අත්සන් කරන ලදි.

බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික සංවර්ධන හවුල්කරුවන්ගෙන් මූල්‍යකරණය ලබා ගැනීමට අමතරව, 2025 දෙසැම්බර් මාසයේදී දිට්වා සුළි කුණාටුවෙන් පසු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි කඩිනම් මූල්‍යකරණ උපකරණ පහසුකම් (RFI) යටතේ (ඇමරිකානු ඩොලර් මිලියන 206 ට සමාන) SDR මිලියන 150.5 ක් හදිසි මූල්‍යකරණයට ප්‍රවේශ වීම සඳහා විදේශීය ණය ගැනීමේ ඒකකය මගින් පහසුකම් සලසන ලදි. කඩිනම් මූල්‍යකරණ අවශ්‍යතා සපුරාලීමටත්, ව්‍යසනයේ මූල්‍ය බලපෑම අවම කිරීමටත් උපකාර වෙමින් මෙම පහසුකම හදිසි ප්‍රතිසාධන සහ පුනරුත්ථාපන උත්සාහයන් සඳහා කාලීන සහාය ලබා දෙන ලදි.

සාර්ව ආර්ථික ස්ථායිකරණය, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහ පෞද්ගලික අංශයේ සංවර්ධන මුලපිරීම්වලට සහාය වීම සඳහා වැඩසටහන් පාදක මූල්‍යකරණය පිළිබඳව ද විදේශීය ණය ගැනීමේ ඒකකය සාකච්ඡා කළ අතර එමඟින් රජයේ පුළුල් ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට දායක විය. ප්‍රධාන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සපයමින්, තිරසාර ආර්ථික වර්ධනය සඳහා පදනම් ශක්තිමත් කරමින් මූල්‍ය හා බාහිර අංශයේ ස්ථාවරත්වයට සහාය වීම සඳහා මෙම අංශය මගින් වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදි.

වගුව 1: සාරාංශය

| | ව්‍යාපෘතිය | ණය දීමනාකරු | ප්‍රමාණය<br>ඇ.එ.ජ. ඩොලර් මිලියන |
|---|---|---|---|
| 1 | ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - 5 වන වාරිකය | ආසියානු සංවර්ධන බැංකුව | 90 |
| 2 | විශ්ව සෞඛ්‍ය ආවරණ වැඩසටහන සඳහා ඒකාබද්ධ සෞඛ්‍ය සේවාව ශක්තිමත් කිරීම | ආසියානු සංවර්ධන බැංකුව | 100 |
| 3 | තිරසාර සංචාරක ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන - උප ව්‍යාපෘතිය 1 | ආසියානු සංවර්ධන බැංකුව | 70 |
| 4 | තිරසර සංචාරක ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන | ආසියානු සංවර්ධන බැංකුව | 30 |
| 5 | සාර්ව ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව සහ විනිවිදභාවය ශක්තිමත් කිරීමේ වැඩසටහන - උප වැඩසටහන | ආසියානු සංවර්ධන බැංකුව | 100 |
| 6 | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනේ අදියර - 2 ව්‍යාපෘතිය | ආසියානු සංවර්ධන බැංකුව | 200 |
| 7 | විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ සහ මූල්‍ය තිරසාරභාවය පිළිබඳ වැඩසටහන - උප වැඩසටහන 2 | ආසියානු සංවර්ධන බැංකුව | 100 |
| 8 | මූල්‍ය අංශයේ ස්ථායිතාව සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන - උප වැඩසටහන 3 | ආසියානු සංවර්ධන බැංකුව | 100 |
| 9 | කෙරවලපිටිය - වරාය L 2වන සම්ප්‍රේෂණ කේබලයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | 52 |
| 10 | ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන සහ දේශගුණික තත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය | ලෝක බැංකුව<br>ජාත්‍යන්තර සංවර්ධන සංගමය | 100 |
| 11 | ශ්‍රී ලංකාව සඳහා සුරක්ෂිත, දැරිය හැකි සහ තිරසාර බලශක්ති ව්‍යපෘතිය | | 30 |
| 12 | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍ය පහසුකම | | 24.5 |
| 13 | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍ය පහසුකම | | 25.5 |
| 14 | මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය - සෞදි සංවර්ධන අරමුදල | සෞදි සංවර්ධන අරමුදල | 10 |
| 15 | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල – කඩිනම් මූල්‍යකරණ උපකරණය (RFI) | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 206 |

### 2.1.3 ආයෝජක සබඳතා සහ වෙළඳපොළ සංවර්ධන ඒකකය (IRU)

ශ්‍රී ලංකාවේ මෙවැනි ආකාරයකින් පළමු වරට, ආයෝජක සබඳතා සහ වෙළඳපොළ සංවර්ධන ඒකකය (IRU) විසින්, එහි ආරම්භයේ සිට 2025 වර්ෂය තුළ සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගන්නා ලදි. ආයෝජක සබඳතා සහ වෙළඳපොළ සංවර්ධන ඒකකය විසින් රාජ්‍ය ණය කළමනාකරණය සඳහා ආයෝජක සබඳතා සහ සන්නිවේදන ප්‍රතිපත්තිය (IRP) මෙන්ම පළමු ආයෝජක සබඳතා උපායමාර්ගය (IRS) කෙටුම්පත් කරන ලදි. 2026 සඳහා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයෙහි පළමු ආයෝජක සබඳතා සැලැස්ම කෙටුම්පත් කිරීම සඳහා ආයෝජක සබඳතා සහ සන්නිවේදන ප්‍රතිපත්තිය සහ ආයෝජක සබඳතා උපායමාර්ගය භාවිත කරන ලදි.

2025 දී මූඩීස් ආයෝජක සේවයේත්, S&P ගෝලීය ශ්‍රේණිගත කිරීම් සහ ෆිච් ශ්‍රේණිගත කිරීම්වලත් නියෝජිතයින්ට ශ්‍රී ලංකාවේ සංචාරය සඳහා, ආයෝජක සබඳතා සහ වෙළඳපොළ සංවර්ධන ඒකකය විසින් පහසුකම් සපයන ලද අතර අවශ්‍ය විටෙක ආර්ථික සංවර්ධනයන් සහ අදාළ ප්‍රතිපත්ති පියවරයන් පිළිබඳ කාලෝචිත යාවත්කාලීන කිරීම් සැපයීම සඳහා සම්මන්ත්‍රණ ඇමතුම් සම්බන්ධීකරණය කරන ලදි. මෙම කටයුතු සන්නිවේදන මාර්ග ශක්තිමත් කරන ලද අතර ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයන්ට නිවැරදි සහ විනිවිද භාවයෙන් යුතු තොරතුරු සැපයීම වැඩි දියුණු කරන ලදි.

ඉතිරි වාණිජ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්පූර්ණ කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකාව මෑත කාලීනව දරන ලද උත්සාහයන් පිළිබිඹු කරමින්, 2025 සැප්තැම්බර් මාසයේදී, S&P ගෝලීය ශ්‍රේණිගත කිරීම් මගින් ශ්‍රී ලංකාවේ විදේශ මුදල් ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීම්වලදී ශ්‍රී ලංකාව දිගුකාලීන වරණීය ණය පැහැර හැරීම් (‘SD’) තත්ත්වයෙන් ‘CCC+’ තත්ත්වය දක්වා උසස් කරන ලදි. මූඩීස් ණය ශ්‍රේණිගත කිරීම් ආයතනය විසින් ශ්‍රී ලංකාවේ Caa1 හි ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීම් ස්ථාවර ඉදිරි දැක්මක් සහිතව තහවුරු කරන ලද අතර, රටේ අඛණ්ඩ ආර්ථික ප්‍රකෘතිය සහ ප්‍රතිසංස්කරණ උත්සාහයන් කෙරෙහි අඛණ්ඩ විශ්වාසය පිළිබිඹු කරමින් ෆිච් ශ්‍රේණිගත කිරීම් ද CCC+ තහවුරු කරන ලදි.

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයෙහි අර්ධ වාර්ෂික ණය වාර්තාව ප්‍රකාශයට පත් කිරීමට අනුකූලව, ආයෝජකයින් සමඟ සෘජුව සම්බන්ධ වීම සඳහා ආයෝජක සබඳතා සහ වෙළඳපොළ සංවර්ධන ඒකකය විසින් 2025 ජූලි මාසයේදී තම පළමු අර්ධ වාර්ෂික ආයෝජක ඇමතුම සංවිධානය කරන ලදි. මෙම ඇමතුම ලන්ඩන් කොටස් වෙළඳපොළේදී නිවේදනය කරන ලදි.

සංවිධානය සමඟ ශ්‍රී ලංකාව පළමු වරිමත් සම්බන්ධතාවය නියෝජනය කළ බැවින්, 2025 දී ආයෝජක සබඳතා පිළිබඳ ජාත්‍යන්තර මූල්‍ය ආයතනය (IIF) සමඟ සම්බන්ධ වීම ආයෝජක සබඳතා සහ වෙළඳපොළ සංවර්ධන ඒකකයේ ක්‍රියාකාරකම්වල සැලකිය යුතු සන්ධිස්ථානයක් සනිටුහන් කරන ලදි. 2025 ජූලි 09 වන දින ප්‍රකාශයට පත් කරන ලද විවිධ භූගෝලීය කලාපවලින් මතුව එන වෙළඳපොළවල් සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් 54 ක් ආවරණය කෙරුණු IIF හි ආයෝජක සබඳතා සහ ණය විනිවිදභාවය පිළිබඳ වාර්තාවට අනුව, ශ්‍රී ලංකාව 2025 දී වඩාත්ම වැදගත් ලකුණු වැඩි කර ගැනීම්වලින් 2023 දී 25.2 සිට 2024 දී 28.21 දක්වා (+9.1 කින්) සමස්ත ලකුණු ප්‍රමාණය ඉහළ නංවා ගනිමින් 5 වන ස්ථානය වාර්තා කරන ලදි.

## 2.2 මධ්‍යම කාර්යාලය

### 2.2.1. ප්‍රතිපත්ති විශ්ලේෂණ ඒකකය (PAU)

ප්‍රතිපත්ති විශ්ලේෂණ ඒකකය තම මූලික වගකීම ඉටු කිරීමේදී සැලකිය යුතු ප්‍රගතියක් ළඟා කර ගෙන ඇත. පහත ජයග්‍රහණ මගින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීම සඳහා ඒකකයේ කැපවීම පිළිබිඹු වේ. :

- මධ්‍ය කාලීන රජයේ ණය ආයෝජන කළඹේ පිරිවැය සහ අවදානම කළමනාකරණය කිරීම සඳහා මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය (MTDS) 2026 – 2030 සකස් කර ප්‍රකාශයට පත් කරන ලදි.

- මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ග පුරෝකථනයන් සමඟ අනුකූලතාවය සහතික කරන්නාවූත්, රජයේ දළ මූල්‍යකරණ අවශ්‍යතා සමඟ ගැලපෙන වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම (ABP) 2026 සකස් කරන ලදි.

- ප්‍රාථමික වෙළඳපොළ වෙන්දේසිවලදී දැනුවත් කර සිදු කරන නිකුත් කිරීමේ තීරණවලට සහාය වීම සඳහා මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගයෙහි නියමිත ඉලක්කයන්ට අනුකූලව භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා කල්පිරීමේ මිශ්‍රණය නිර්මාණය කරන ලදි.
- පවතින වෙළඳපොළ අනුපාත සහ වෙළඳපොළ ප්‍රවණතාවයන් සමඟ අනුගත වෙමින් නව භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමට අදාළව කූපන්පත් අනුපාත තීරණය කිරීම සඳහා නිර්දේශ ලබා දෙන ලදි.
- රාජ්‍ය ණය කළමනාකරණ රෙගුලාසි අංක 01/2025 සහ අංක 02/2025 කෙටුම්පත් කර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.
- රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ මාර්ගෝපදේශ (I කොටස) සහ ණය සුරැකුම්පත් සහ ණය දීම සඳහා මාර්ගෝපදේශ කෙටුම්පත් කරන ලද අතර එය මුදල් අමාත්‍යවරයා මගින් නිකුත් කිරීමට පහසුකම් සලසන ලදි.
- රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි අත්පොත කෙටුම්පත් කරන ලදි.
- මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව සඳහා ණය කළමනාකරණ ක්‍රියාකාරකම්, ප්‍රතිඵල සහ රජයේ ණය කළඹේ සමස්ත තත්ත්වය පිළිබඳ මූල්‍ය අවදානම් ප්‍රකාශය සඳහා අවශ්‍ය වන යෙදවුම් සපයන ලදි.
- රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය තුළ තාක්ෂණික විශේෂඥතාව සහ ආයතනික ධාරිතාව වැඩි දියුණු කරමින් මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සහ වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදි.

**අනාගත ඉදිරි දැක්ම**

**තාක්ෂණික වශයෙන් ශක්තිමත් කිරීම :** ණය තිරසාරත්ව විශ්ලේෂණය, අවදානම් ආකෘතිකරණය, සම්මත නිකුත් කිරිමේ ප්‍රතිපත්ති සැකසීම, සහ ඵලදා අනුපාත වක්‍ර සංවර්ධනය වැනි ක්ෂේත්‍රවල ඉලක්කගත පුහුණුව හා තාක්ෂණික සහාය මගින් ආයතනික ධාරිතාව වැඩි දියුණු කිරීම.

**ආයතන අතර සම්බන්ධීකරණය :** බාධාවන්ගෙන් තොරව තොරතුරු හුවමාරුවටත්, වඩා සඵලදායක වාර්තාකරණයටත් අවකාශ සපයමින් සම්බන්ධීකරණ රාමු ශක්තිමත් කිරීම.

**උසස් සහ ක්‍රියාකාරී ණය කළමනාකරණය :** අඛණ්ඩ වගකීම් කළමනාකරණ මෙහෙයුම්, මූල්‍ය වෙළඳපොළ ප්‍රවණතා පිළිබඳ ක්‍රියාකාරී අධීක්ෂණය සහ ණය ආයෝජන කළඹේ පිරිවැය සහ අවදානම් පැතිකඩ කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා නව්‍ය ණය කළමනාකරණ ක්‍රමවේද සංවර්ධනය කිරීම ඇතුළුව වඩාත් නව්‍ය ණය කළමනාකරණ පිළිවෙත් හඳුන්වා දීම.

### 2.2.2. ණය අවදානම් විශ්ලේෂණ සහ අධීක්ෂණ ඒකකය (RAMU)

වසර තුළදී, අප වෙත පැවරී ඇති වගකීම ඉටු කිරීම සඳහා,

- ජාත්‍යන්තර හොඳම භාවිතයන් මත පදනම්ව රාජ්‍ය ව්‍යවසාය සඳහා ණය අවදානම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය සකස් කර, අනතුරුව ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී.
- අනෙකුත් ආයතන සඳහා අදාළ වන වෙනත් ණය අවදානම් තක්සේරු ක්‍රමවේදයක් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කරන ලදි.
- ආයෝජන කළඹ මට්ටමේ ණය ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම ඇතුළුව ඒකකයේ අනෙකුත් ප්‍රධාන කාර්යයන් සඳහා ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටි සකස් කරන ලදි.

වසර තුළ රාජ්‍ය ව්‍යවසායයන් කිහිපයක් සඳහා සිදු කරන ලද ණය අවදානම් තක්සේරු කිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ;

| ව්‍යාපෘති නාමය | ණය ලබා දෙන ආයතනය | ප්‍රතිලාභී රාජ්‍ය ව්‍යවසාය | උප ණය/ ඇපකර | ණය මුදල (ඇ.එ.ජ.ඩො.) |
|---|---|---|---|---|
| කෙරවලපිටිය - වරාය L දෙවැනි සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය - **නව** | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | උප-ණය | 52 |
| ශ්‍රී ලංකාව සඳහා ආරක්ෂාකාරී, දැරිය හැකි සහ තිරසාර විදුලිබල ව්‍යාපෘතිය - **නව** | ලෝක බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | උප-ණය | 30 |
| සාම්පූර් - කප්පල්තුරේ විදුලි සම්ප්‍රේෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - **නව** | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | උප-ණය | 22 |
| කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය - **ප්‍රතිව්‍යුහගත කරන ලද** | චීන සංවර්ධන බැංකුව | ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය | ණය මුදලින් 75% - බැඳීම් ප්‍රකාශය මත (Undertaking) ණය මුදලින් 25% - ඇපකරය මත | මුල් ණය - 54.79 ප්‍රතිව්‍යුහගත කරන ලද - 45.80 |
| තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය - **ප්‍රතිව්‍යුහගත කරන ලද** | චීන සංවර්ධන බැංකුව | ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය | ණය මුදලින් 100% - බැඳීම් ප්‍රකාශය මත (Undertaking) | මුල් ණය - 102.54 ප්‍රතිව්‍යුහගත කරන ලද - 40.55 |
| ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය - **ප්‍රතිව්‍යුහගත කරන ලද** | චීන සංවර්ධන බැංකුව | ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය | ණය මුදලින් 75% - බැඳීම් ප්‍රකාශය මත (Undertaking) ණය මුදලින් 25% - ඇපකරය මත | මුල් ණය - 195.08 ප්‍රතිව්‍යුහගත කරන ලද - 118.51 |
| පොල්ගහවෙල, පොතුහැර සහ අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය **- ප්‍රතිව්‍යුහගත කරන ලද** | ඉන්දියානු එක්සිම් බැංකුව | ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය | ණය මුදලින් 100% - ඇපකරය මත | මුල් - 91.8 ප්‍රතිව්‍යුහගත කරන ලද - 59.13 ප්‍රතිව්‍යුහගත නොකරන ලද – 1.68 |

| | | | | |
|---|---|---|---|---|
| අළුත්ගම, මතුගම සහ අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය **- ප්‍රතිව්‍යුහගත කරන ලද** | ඉන්දියානු එක්සිම් බැංකුව | ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය | ණය මුදලින් 100% - ඇපකරය මත | මුල් -164.9 ප්‍රතිව්‍යුහගත කරන ලද - 90.16 ප්‍රතිව්‍යුහගත නොකරන ලද – 1.42 |
| අරමුදල්ගත කළ පොලී කාලීන ණය (Funded Interest Term Loan) **ප්‍රතිව්‍යුහගත කරන ලද** | ඉන්දියානු එක්සිම් බැංකුව | ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය | ණය මුදලින් 100% - ඇපකරය මත | 5.38 |
| බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය - **ප්‍රතිව්‍යුහගත කරන ලද** | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම | ඇපකර | ප්‍රතිව්‍යුහගත කරන ලද - JPY 15,091,857,367 ප්‍රතිව්‍යුහගත නොකරන ලද - JPY 13,426,321,054 |

වාර්තාකරණ කාල සීමාව තුළ තනි ණය අවදානම් තක්සේරු කිරීම්වලට අමතරව, සමස්ත භාණ්ඩාගාර ඇපකර කළඹ සහ උප ණය කළඹෙන් පැනනගින මූල්‍ය අවදානම් තක්සේරු කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, 2026 මූල්‍ය අවදානම් ප්‍රකාශය සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දෙන ලදි.

**ඉදිරි දැක්ම**

- රාජ්‍ය ව්‍යවසායයන්ගේ මූල්‍ය සෞඛ්‍යය තක්සේරු කිරීම සඳහා භාවිතවන ක්‍රමවේදයන් ජාත්‍යන්තර හොඳම භාවිතයන්ට අනුකූලව, ශක්තිමත් කරමින්, දැනට පවතින ණය අවදානම් තක්සේරු රාමුව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා පියවර ආරම්භ කර ඇත.

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකු තාක්ෂණික සහාය ඇතිව, භාණ්ඩාගාර ඇපකර නැවත කැඳවීම සහ අක්‍රීය වූ උපණය කළමනාකරණය කිරීම සඳහා ව්‍යුහගත ක්‍රියාවලියක් සහ ක්‍රියාපටිපාටි සංවර්ධනය කිරීමේ කටයුතු සිදුකෙරෙමින් පවතී.

- ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව තත්‍ය කාලීන අධීක්ෂණයට පහසුකම් සැලසීම සඳහා අන්තර්ක්‍රියාකාරී දත්ත පුවරුවක් සංවර්ධනය කිරීම සඳහා සාකච්ඡා සිදු කරමින් පවතී.

### 2.2.3 අවදානම් පාලන සහ අනුකූලතා ඒකකය (RCU)

**2025** වර්ෂය තුළ, අවදානම් පාලන සහ අනුකූලතා ඒකකය විසින් අදාළ විධිවිධාන සහ මාර්ගෝපදේශයන්ට අනුකූලව පහත සඳහන් ජයග්‍රහණ සාර්ථකව අත්පත් කර ගන්නා ලදි.

- රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ සියලුම නිලධාරීන්ට අදාළ වන චර්යාධර්ම සංග්‍රහය සකස් කරන ලදි.
- රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ ඉදිරි කාර්යාලය, මධ්‍යම කාර්යාලය, පසුපස කාර්යාලය, පරිපාලන අංශය සහ මූල්‍ය අංශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් පැන නගින විභව අවදානම් ආමන්ත්‍රණය කිරීම සඳහා අවදානම් කමිටුව පිහිටුවන ලදි.

- අවදානම් කමිටුව ඇතුළු සියලුම නිලධාරීන් සඳහා අවදානම පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම, සකස් කරන ලද අවදානම් වාර්තාව ඉදිරිපත් කිරීම සහ අවදානම් කළමනාකරණ රාමුව පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීම සඳහා **2025** දී අවදානම් කමිටු රැස්වීම් තුනක් පවත්වන ලදී.

- මෙහෙයුම් අවදානම කළමනාකරණය කිරීමේ ප්‍රගතිය වාර්තා කිරීම සඳහා පළමු, දෙවන, තෙවන, සිව්වන කාර්තු සඳහා කාර්තුමය අවදානම් වාර්තා හතරක් සහ **2025** දේශීය ණය ගැනීමේ සීමාවන් පිළිබඳ විශේෂ වාර්තාවක් සකස් කර පසුව රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන ලදී.

- නිලධාරීන් විසින් සිදු කරන ලද සදාචාරාත්මක කරුණු සහ ස්වයං හෙළිදරව් කිරීම් සමාලෝචනය කිරීම සහ අවසානයේ අදාළ කරුණු පිළිබඳව තීරණ ගැනීම සඳහා ආචාරධර්ම කමිටුව පිහිටුවන ලදී.

**අනාගත ඉදිරි දැක්ම**

අවදානම් පාලන සහ අනුකූලතා ඒකකය විසින් අඛණ්ඩතාව, ඉහළ සදාචාරාත්මක ප්‍රමිතීන් සහ ශක්තිමත් අවදානම් දැනුවත්බව පිළිබඳ සංස්කෘතිය ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් කාර්යයන් සිදු කිරීමට අරමුණු කරනු ලබයි.

- කාර්යය අඛණ්ඩතා සැලැස්ම සංවර්ධනය කර නිතිපතා පරීක්ෂා කිරීම.
- ණය කළඹේ කාර්ය සාධන ක්‍රියාකාරකම් පිළිබඳව නිතිපතා අධීක්ෂණය කිරීම.
- රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ ප්‍රධානීන්ට පූර්ව අනතුරු ඇඟවීම් සකස් කිරීම.
- මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සකස් කිරීම
- අර්බුද කළමනාකරණ සැලැස්ම සකස් කිරීම.
- අවදානම් කළමනාකරණ රාමුව සකස් කිරීම.

## 2.3 පසුපස කාර්යාලය

### 2.3.1 ණය වාර්තා කිරීමේ ඒකකය (DRU)

**ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය**

2022 අප්‍රේල් මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය ණය සේවා තාවකාලිකව විලම්භනය කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා රජය විසින් විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී ලංකාවේ සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇත. ද්විපාර්ශ්වික, වාණිජමය සහ බහුපාර්ශ්වික ණයහිමි කාණ්ඩ හරහා සැලකිය යුතු සන්ධිස්ථාන කරා ළඟා වී ඇත. 2024 ජූනි 26 වන දින, ශ්‍රී ලංකාව විසින් රටේ ප්‍රධාන ද්විපාර්ශ්වික ණය දෙන්නන් නියෝජනය කරන නිල ණයහිමි කමිටුවේ (OCC) සාමාජිකයින් සමඟ ණය පිළියම් ගිවිසුමක් අවසන් කරන ලදී. එදිනම, ශ්‍රී ලංකාව විසින් චීන අපනයන-ආනයන බැංකුව සමඟ එම ආයතනයට ගෙවිය යුතු ණය සඳහා ද්විපාර්ශ්වික ණය පිළියම් ගිවිසුම් ද සම්පූර්ණ කරන ලදී. මෙම ගිවිසුම් ක්‍රියාත්මක කරන ලද්දේ සංශෝධන විධිවිධාන අත්සන් කිරීම මඟින් වන අතර, චීන එක්සිම් බැංකුව සමඟ ණය පිළියම් ක්‍රියාවලිය සම්පූර්ණ කරමිනි. 2024 දෙසැම්බර් 24 වන දින චීන සංවර්ධන බැංකුව සමඟ සංශෝධන ගිවිසුම් අත්සන් කිරීමත් සමඟ තවදුරටත් ප්‍රගතිය අත්කර ගත් අතර, එම ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ අවසානය ද සනිටුහන් විය. මේ අතර, ශ්‍රී ලංකාව 2024 සැප්තැම්බර් 19 වන දින ජාත්‍යන්තර රාජ්‍ය බැඳුම්කර (ISB) හිමියන් සමඟ ජාත්‍යන්තර රාජ්‍ය බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය වශයෙන් ගිවිසුමකට එළඹුණි. අනතුරුව 2024 දෙසැම්බර් 16 වන දින හිඟ ජාත්‍යන්තර රාජ්‍ය බැඳුම්කර නව බැඳුම්කර බවට හුවමාරු කිරීම අවසන් කරන ලද අතර, එමඟින් සියයට 98 කට ආසන්න සහභාගීත්ව අනුපාතයක් අත්කර ගත් අතර, පැහැර හරින ලද ජාත්‍යන්තර රාජ්‍ය බැඳුම්කර සියල්ලම පාහේ නව ජාත්‍යන්තර රාජ්‍ය බැඳුම්කර බවට පරිවර්තනය කිරීමට පහසුකම් සළසන ලදී.

පැරිස් සමාජ සාමාජිකයින් සමඟ ද්විපාර්ශ්වික ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී ශ්‍රී ලංකාව විසින්ද වැදගත් ජයග්‍රහණ ලබා ගන්නා ලදි. ජපන් රජය, ඉන්දියානු අපනයන-ආනයන බැංකුව සහ ප්‍රංශ ජනරජයේ රජය සමඟ ද්විපාර්ශ්වික සංශෝධන ගිවිසුම් අත්සන් කිරීමෙන් ප්‍රධාන ජයග්‍රහණ මාලාවක් සනිටුහන් කරන ලදි. ජපානය සමඟ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය 2025 මාර්තු 24 වන දින අවසන් කරන ලද අතර, ඉන් පසුව 2025 මාර්තු 25 වන දින ඉන්දියානු අපනයන-ආනයන බැංකුව සමඟ ද්විපාර්ශ්වික සංශෝධන ගිවිසුම් (ණය රේඛා) සහ 2025 අප්‍රේල් 3 වන දින (ගැනුම්කරුගේ ණය ගිවිසුම්) අත්සන් කරන ලදි. 2025 ජුනි 16 වන දින ප්‍රංශ ජනරජයේ රජය සමඟ ද්විපාර්ශ්වික සංශෝධන ගිවිසුම් සම්පූර්ණ කිරීමත් සමඟ, 2025 ජූලි 01 වන දින හංගේරියාවේ එක්සිම් බැංකුවත්, 2025 අගෝස්තු 22 වන දින එක්සත් රාජධානිය සමඟත්, ශ්‍රී ලංකාව එහි ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියෙන් ආසන්න වශයෙන් 94% ක් සම්පූර්ණ කර ඇත. පැරිස් සමාජ සාමාජිකයින් සමඟ ද්විපාර්ශ්වික ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී ශ්‍රී ලංකාවට ද වැදගත් වාසි ලැබිණි.

ජපන් රජය, ඉන්දියානු අපනයන-ආනයන බැංකුව සහ ප්‍රංශ ජනරජයේ රජය සමඟ ද්විපාර්ශ්වික සංශෝධන ගිවිසුම් අත්සන් කිරීමෙන් ප්‍රධාන ජයග්‍රහණ මාලාවක් සනිටුහන් විය. ජපානය සමඟ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය 2025 මාර්තු 24 වන දින අවසන් කරන ලද අතර, ඉන් පසුව 2025 මාර්තු 25 වන දින ඉන්දියානු අපනයන-ආනයන බැංකුව (ණය රේඛා) සහ 2025 අප්‍රේල් 3 වන දින (ගැනුම්කරුගේ ණය ගිවිසුම්) ද්විපාර්ශ්වික සංශෝධන ගිවිසුම් අත්සන් කරන ලදි. ශ්‍රී ලංකාව 2025 ජුනි 16 වන දින ප්‍රංශ ජනරජයේ රජය සමඟත්, 2025 ජූලි 01 වන දින හංගේරියාවේ EXIM බැංකුව සමඟත්, 2025 ජූලි 14 වන දින සෞදි අරමුදල සමඟත්, 2025 අගෝස්තු 22 වන දින එක්සත් රාජධානිය සමඟත් ද්විපාර්ශ්වික සංශෝධන ගිවිසුම් අත්සන් කර ඇත. 2025 ඔක්තෝබර් 27 වන දින ඕස්ට්‍රේලියානු රජය සමඟ සහ 2025 නොවැම්බර් 11 වන දින ඩෙන්මාර්ක රජය සමඟ ද්විපාර්ශ්වික සංශෝධන ගිවිසුම් අත්සන් කිරීම අවසන් වීමත් සමඟම, ශ්‍රී ලංකාව සිය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන යටතේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම් අත්සන් කිරීමේ ක්‍රියාවලියෙන් ආසන්න වශයෙන් 95% ක් සම්පූර්ණ කර ඇත. මෙම ගිවිසුම්වල ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකාව අදාළ ණයහිමි හවුල්කරුවන් වෙත නිතිපතා ණය සේවාකරණය නැවත ආරම්භ කර ඇත.

**පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ දත්ත සටහන් කිරීමේ සහ කළමනාකරණ පද්ධතියේ දත්ත පද්ධතිය පොදුරාජ්‍ය මණ්ඩලීය ප්‍රධානතම ස්ථානය වෙත සංක්‍රමණය කිරීම**

2025 අගෝස්තු 10-15 අතරතුර කාලසීමාවේදී ශ්‍රී ලංකාව තුළ සිදු කරන ලද අවශ්‍යතා ඇගයීමේ මෙහෙයුම සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය දත්ත පද්ධතිය පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ දත්ත සටහන් කිරීමේ සහ කළමනාකරණ පද්ධතියේ දත්ත පද්ධතියේ සිට පොදුරාජ්‍ය මණ්ඩලීය ප්‍රධානතම ස්ථානය වෙත සාර්ථකව සංක්‍රමණය කිරීම.

පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ දත්ත සටහන් කිරීමේ සහ කළමනාකරණ පද්ධතියේ දත්ත පද්ධතියේ (CS-DRMS) සිට පොදුරාජ්‍ය මණ්ඩලීය ප්‍රධානතම වේදිකාව වෙත සංක්‍රමණය කිරීමේ කොටසක් ලෙස, 2025 නොවැම්බර් 24 සිට දෙසැම්බර් 5 දක්වා පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ ණය කළමනාකරණ ඒකකය විසින් පවත්වන ලද පොදුරාජ්‍ය මණ්ඩලීය මෙරීඩියන් පුහුණු සහ දත්ත වලංගුකරණ වැඩසටහනට රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ (PDMO) නිලධාරීන් හත් දෙනෙකු සාර්ථකව සහභාගී විය. මෙම වැඩසටහන සංවිධානය කරන ලද්දේ පොදුරාජ්‍ය මණ්ඩලීය මෙරීඩියන් වැඩසටහනට අනුවය.

මෙම වැඩසටහනේ මූලික අරමුණු වූයේ සංක්‍රමණික ණය දත්තවල නිරවද්‍යතාව සහ සම්පූර්ණත්වය තහවුරු කිරීම, පොදුරාජ්‍ය මණ්ඩලීය Meridian හි රාජ්‍ය ණය වාර්තා මෙහෙයවීම සහ නඩත්තු කිරීම පිළිබඳ පුළුල් ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම සහ 2026 මුල් භාගයේදී සැලසුම් කරන ලද පද්ධතිය සජීවීකරණය වීමට පෙර සංක්‍රාන්ති කාලය තුළ පොදුරාජ්‍ය මණ්ඩලීය Meridian සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ දත්ත සටහන් කිරීමේ සහ කළමනාකරණ පද්ධතියේ දත්ත පද්ධතිය / Excel-පාදක පද්ධතිවල සමාන්තර මෙහෙයවීම සඳහා ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීමයි.

මෙම පුහුණුව මඟින් ශ්‍රී ලංකාවේ සංක්‍රමණික රාජ්‍ය ණය දත්ත පද්ධතිය භාවිත කරමින් පුළුල් දත්ත වලංගුකරණය සහ සංසන්දනය කිරීම අභ්‍යාස සමඟ ප්‍රායෝගික පද්ධති පාදක ඉගෙනුම් සැසි ඒකාබද්ධ විය.

මෙම වැඩසටහන මගින් රාජ්‍ය ණය දත්ත කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ නිලධාරීන්ගේ තාක්ෂණික ධාරිතාවය ශක්තිමත් කරන ලද අතර රජයේ ප්‍රාථමික ණය සටහන් කිරීමේ සහ කළමනාකරණ පද්ධතිය ලෙස Commonwealth Meridian ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික සූදානම වැඩි දියුණු කරන ලදි. පුහුණුව සාර්ථකව නිම කිරීමෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණ යටිතල පහසුකම් නවීකරණය කිරීමේ සහ ණය සටහන් කිරීම, වාර්තා කිරීම සහ විශ්ලේෂණාත්මක කාර්යයන් ඩිජිටල් පරිවර්තනය කිරීමට සහාය වීමේ වැදගත් සන්ධිස්ථානයක් නියෝජනය කරන ලදි.

**අනාගත ඉදිරි දැක්ම**

පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ දත්ත සටහන් කිරීමේ සහ කළමනාකරණ පද්ධතියේ දත්ත පද්ධතිය (CS-DRMS) පොදුරාජ්‍ය මණ්ඩලීය මෙරිඩියන් වේදිකාව වෙත සාර්ථකව සංක්‍රමණය කිරීමෙන් හා පුහුණු සහ දත්ත වලංගුකරණ වැඩසටහන සම්පූර්ණ කිරීමෙන් පසුව, ණය දත්තවල නිරවද්‍යතාව, පරිපූර්ණත්වය හා විශ්වාසදායකබව සහතික කිරීම සඳහා, පවත්නා ණය සටහන් කිරීමේ පද්ධතීන් සහ පොදු රාජ්‍ය මණ්ඩලීය මෙරිඩියන්හි සමාන්තර මෙහෙයුම් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් තවදුරටත් අඛණ්ඩව සිදු කරනු ඇත. මෙම කාල සීමාවේදී, පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයද සමඟින් එක්ව සංසන්දනය, වලංගුකරණය සහ පද්ධති පිරිපහදු කිරීමේ ක්‍රියාකාරකම් තවදුරටත් සිදු කෙරෙනු ඇත. මෙම ක්‍රියාකාරකම් සාර්ථකව නිම කිරීමට යටත්ව ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය සටහන් කිරීම, කළමනාකරණය, වාර්තා කිරීම සහ විශ්ලේෂණය සඳහා මූලික වේදිකාව ලෙස එම පද්ධතියට සේවය කිරීමට හැකි වන පරිදි, 2026 අගෝස්තු මස අවසන් වන විට Commonwealth Meridian වෙත සම්පූර්ණ සංක්‍රමණය අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

**මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර සුරැකුම්පත් සහ සැනසිලි ලිපි**

2025 වසර තුළ, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය (PDMO) විසින් රජය සතු ව්‍යාවසායන් සහ අනෙකුත් සුදුසුකම් ලත් ආයතන වෙත නිකුත් කරන ලද භාණ්ඩාගාර සුරැකුම්පත් සහ සැනසිලි ලිපි කළමනාකරණය, අධීක්ෂණය සහ සටහන් කිරීම සඳහා මහා භාණ්ඩාගාරයට අඛණ්ඩව සහාය වෙන ලදි. ඉල්ලීම් ඇගයීම, සුරැකුම්පත් සටහන් නඩත්තු කිරීම, අවිනිශ්චිත වගකීම් අධීක්ෂණය කිරීම සහ සහතික කරන ලද බැඳීම්වලින් පැන නගින රජයේ නිරාවරණය වාර්තා කිරීම මෙයට ඇතුළත් විය.

2025 දෙසැම්බර් 31 දින වන විට, ප්‍රතිලාභී ආයතන 33 ක් සඳහා නිකුත් කරන ලද සුරැකුම්පත් ගිවිසුම් 144 ක් ආවරණය කරමින්, භාණ්ඩාගාර සුරැකුම්පත්වල හිඟ තොගය රුපියල් මිලියන 436,275.69 ක් විය. 2025 දෙසැම්බර් 31 දින වන විට සැනසිලි ලිපිවල මුළු හිඟ වටිනාකම රුපියල් මිලියන 789.60 ක් ලෙස වාර්තා විය.

භාණ්ඩාගාර සුරැකුම්පත් සහ සැනසිලි ලිපි අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම රාජ්‍ය අංශය තුළ අවිනිශ්චිත වගකීම් කළමනාකරණය ශක්තිමත් කිරීමටත්, මූල්‍ය අවදානම් අධීක්ෂණය වැඩි දියුණු කිරීමටත් දායක විය.

**රාජ්‍ය ව්‍යවසායයන් සඳහා මහා භාණ්ඩාගාරයෙන් නිකුත් කරන ලද භාණ්ඩාගාර සුරැකුම්පත් ණය**

| අංකය. | ආයතනයේ නම | බැංකුවේ / ආයතනයේ නම | හිග ප්‍රමාණය - 2025.12.31 දිනට ප්‍රාග්ධනය | | | | එකතුව (ඇ.එ.ජ. ඩොලර් මිලියන) |
|---|---|---|---|---|---|---|---|
| | | | ඇ.එ.ජ. ඩොලර් මිලියන | යූරෝ මිලියන | ජපන් යෙන් මිලියන | රුපියල් මිලියන | |
| **1** | ශ්‍රී ලංකා මහ බැංකුව | ඉන්දියාවේ රිසර්ව් බැංකුව | 651.43 | | | | 651.43 |
| **2** | මාර්ග සංවර්ධන අධිකාරිය | ලංකා බැංකුව | | | | 93,800.02 | 675.70 |
| | | කොමර්ෂල් බැංකුව | | | | | |
| | | ඩී එෆ් සී සී බැංකුව | | | | 3,478.26 | |
| | | හැටන් නැෂනල් බැංකුව | | | | | |
| | | සී/ස ජාතික සංවර්ධන පුද්ගලික බැංකු සමාගම | | | | | |
| | | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | | | 67,777.55 | |
| | | මහජන බැංකුව | 7.36 | | | 32,899.16 | |
| | | සම්පත් බැංකුව | | | | 9,227.27 | |
| **3** | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | ලංකා බැංකුව | | | | 34,096.48 | 766.75 |
| | | චීන සංවර්ධන බැංකුව | 193.73 | | | | |
| | | කොමර්ෂල් බැංකුව | | | | 427.65 | |
| | | ඩීඑෆ් සී සී බැංකුව | | | | 2,701.08 | |
| | | ඉන්දියාවේ එක්සිම් බැංකුව | 161.17 | | | | |
| | | හැටන් නැෂනල් බැංකුව | | | | 7,049.13 | |
| | | ING බැංකුව, නෙදර්ලන්තයේ NV | | 71.32 | | | |
| | | සී/ස ජාතික සංවර්ධන පුද්ගලික බැංකු සමාගම | | | | 13,651.70 | |
| | | සී/ස ජාතික සංවර්ධන පුද්ගලික බැංකු සමාගම | | | | | |
| | | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | | | 25,682.48 | |
| | | මහජන බැංකුව | | | | 3,255.80 | |
| | | යුනි ක්‍රෙඩිට් බැන්ක් ඔස්ට්‍රියා ඒජී | | 40.8 | | | |
| **4** | සීමාසහිත ශ්‍රී ලංකා ගුවන් සේවය ලිමිටඩ් | ලංකා බැංකුව | | | | | 186.60 |
| | | සීමාසහිත ඩීබී ට්‍රස්ටීස් (හොංකොං) | 175 | | | | |
| | | ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය | 11.6 | | | | |
| | | මහජන බැංකුව | | | | | |
| **5** | ලංකා විදුලිබල මණ්ඩලය | ආසියානු සංවර්ධන බැංකුව | 307.57 | | | | 360.71 |
| | | ලංකා බැංකුව | | | | 114.19 | |
| | | හැටන් නැෂනල් බැංකුව | | | | | |
| | | සීමාසහිත චීන කාර්මික සහ වාණිජ බැංකුව | 26.53 | | | | |
| | | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | | | 3,000.00 | |
| | | මහජන බැංකුව | | | | 5,135.34 | |
| **6** | සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම (ශ්‍රී ලංකාව) | හැටන් නැෂනල් බැංකුව | | | | 4000 | 214.63 |
| | | සි/ස හොංකොං ඇන්ඩ් ෂැංහයි පුද්ගලික බැංකු සමාගම | 29.49 | | | | |
| | | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) | | | 26947 | | |
| **7** | ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව | ලංකා බැංකුව | | | | 72040.78 | 256.75 |
| | | චීන ජාතික රසායනික ඉංජිනේරු ආයතනය අංක 14 සීමාසහිත ඉදිකිරීමේ සමාගම | 19.73 | | | | |
| | | මහජන බැංකුව | 4.63 | | | | |
| **8** | ලංකා බැංකුව සහ මහජන බැංකුව | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) | 80 | | | | 80.19 |
| | | අපනයන සංවර්ධන මණ්ඩලය | | | | 60 | |
| **9** | ජනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | ලංකා බැංකුව | | | | 6.09 | 93.74 |
| | | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | | | 29,053.00 | |
| **10** | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | ආසියානු සංවර්ධන බැංකුව | 50 | | | | 50 |
| **11** | සීමාසහිත ලංකා නාවික සංස්ථාව | මහජන බැංකුව | 47.55 | | | | 47.55 |
| **12** | සීමාසහිත මිහින් ලංකා සමාගම | ලංකා බැංකුව | | | | | |
| | | මහජන බැංකුව | | | | | |
| **13** | සීමාසහිත ව්‍යාපාර කළමනාකරණජාතික පාසල | ලංකා බැංකුව | | | | 4,535.00 | 14.63 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **14** | සීමාසහිත ලංකා සතොස | මහජන බැංකුව | | | | | |
| **15** | ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව | මහජන බැංකුව | | | | 11.84 | 0.04 |
| **16** | සීමාසහිත ලංකා දැව අඟුරු පුද්ගලික සමාගම | ලංකා බැංකුව | | | | 19,610.25 | 63.26 |
| **17** | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | ලංකා බැංකුව | | | | 2,299.99 | 7.42 |
| **18** | සීමාසහිත ටෙක්නො පාර්ක් සංවර්ධන පුද්ගලික සමාගම | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | | | | |
| | | මහජන බැංකුව | | | | | |
| **19** | ශ්‍රී ලංකා ඉඩම් ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | | | | |
| **20** | වී අලෙවි මණ්ඩලය | මහජන බැංකුව | | | | | |
| **21** | රාජ්‍ය සංවර්ධන හා ඉදි කිරීමේ සංස්ථාව | ලංකා බැංකුව | | | | 990.61 | 3.20 |
| **22** | සමුපකාර තොග වෙළඳ ආයතනය | වී අලෙවි මණ්ඩලය | | | | 729.6 | 2.35 |
| **23** | ජාතික මුද්‍රණ සංස්ථාව | මහජන බැංකුව | | | | 17.26 | 0.06 |
| **24** | සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | ලංකා බැංකුව | | | | 500 | 1.61 |
| **25** | ලංකා ධීවර සංස්ථාව | ලංකා බැංකුව | | | | | |
| **26** | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | ලංකා බැංකුව | | | | 55.26 | 0.18 |
| **27** | සීමාසහික නෝර්ත් සී | ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව | | | | | |
| | | ලංකා බැංකුව | | | | | |
| **28** | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | මහජන බැංකුව | | | | 69.9 | 0.23 |
| **29** | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | ලංකා බැංකුව | | | | | |
| **30** | ජාතික කඩදාසි සංස්ථාව | මහජන බැංකුව | | | | | |
| **31** | සීමා සහිත ලංකා විදුලිබල පුද්ගලික සමාගම | ආසියානු සංවර්ධන බැංකුව | 0.53 | | | | 0.53 |
| **32** | බල ක්‍රියාකාරකම්වලට සහයෝගය දිමේ පහසුකම (ලංකා විදුලිබල මණ්ඩලය) | ආසියානු සංවර්ධන බැංකුව | 6.8 | | | | 6.80 |
| **33** | බල පද්ධති සවිබල ගැන්වීමේ සහ නැවත පිළිසකර කළ හැකි ශක්ති ඒකාබද්ධ කිරිමේ ව්‍යාපෘතිය | ආසියානු සංවර්ධන බැංකුව | 0.16 | | | | 0.16 |
| | **මුළු එකතුව** | | **1,773.28** | **112.12** | **26,947.00** | **436,275.69** | **3,484.52** |

**2025.12.31 දින දක්වා මහා භාණ්ඩාගාරයෙන් නිකුත් කරන ලද පහසුව සළසා දීමේ හිඟ ලැයිස්තුව**

| අනුක්‍රමික අංකය | ආයතනයේ නම | බැංකුවේ හෝ ආයතනයේ නම | ණය ප්‍රමාණය | | | | නිකුත් කළ දිනය | ඉකුත් වන දිනය | හිඟ ප්‍රමාණය - 2025.12.31 දිනට ප්‍රාග්ධනය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ඇ.එ.ජ. ඩොලර් මිලියන | යූරෝ මිලියන | ජපන් යෙන් මිලියන | රුපියල් මිලියන | | | ඇ.එ.ජ. ඩොලර් මිලියන | යූරෝ මිලියන | ජපන් යෙන් මිලියන | රුපියල් මිලියන |
| 1 | සමුපකාර තොග වෙළඳ ආයතනය | වී අලෙවි මණ්ඩලය | | | | 440.00 | 11-ජනවාරි-2017 | 11-ජනවාරි-2018 | 0.00 | | | 440.00 |
| 2 | සමුපකාර තොග වෙළඳ ආයතනය | වී අලෙවි මණ්ඩලය | | | | 440.00 | 2017 මාර්තු 01 | 2018 පෙබරවාරි 22 | 0.00 | | | 289.60 |
| 3 | ලංකා බැංකුව සහ මහජන බැංකුව | අපනයන සංවර්ධන මණ්ඩලය | | | | 60.00 | 2018 මාර්තු 29 | 2018 පෙබරවාරි 28 | | | | 60.00 |
| | **නිකුත් කරන ලද මුදලින් එකතුව** | | **0.00** | **0.00** | **0.00** | **940.00** | | | **0.00** | **0.00** | **0.00** | **789.60** |
| | **2025.12.31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව දක්වන විනිමය අනුපාත** | | **309.9944** | **363.9644** | **1.9814** | | | | **309.99** | **363.96** | **1.98** | **1.00** |
| | **එකතුව රුපියල්වලින්** | | **0.00** | **0.00** | **0.00** | **940.00** | | | | | | |
| | **මුළු එකතුව** | | | | | **940.00** | | | | | | **789.60** |

## 2.3.2 ණය සේවාකරණ ඒකකය

### 2025 වර්ෂය සඳහා ණය සේවාකරණය

2025 වර්ෂයේදී, ශ්‍රී ලංකා මහ බැංකුවේ PDD හි සහයෝගීතාවයෙන් දේශීය හා විදේශීය ණය සඳහා රුපියල් ට්‍රිලියන 8.7 ක් සේවාකරණය කරන ලදි. භාණ්ඩාගාර බිල්පත් ආපසු ගෙවීම් ආසන්න වශයෙන් රුපියල් ට්‍රිලියන 6.3 ක් වූ අතර එය විශාලතම ණය-සේවා සංරචකය නියෝජනය කරයි. භාණ්ඩාගාර බැඳුම්කර ගෙවීම් රුපියල් ට්‍රිලියන 1.7 ඉක්මවා ගිය අතර එය සැලකිය යුතු පුනරාවර්තන මූල්‍යන පිරිවැයක් පෙන්නුම් කරයි. විදේශ ණය ආපසු ගෙවීම් ආසන්න වශයෙන් රුපියල් බිලියන 762 ක් විය. (ව්‍යාපෘති ණය සහ දීර්ඝ කාලීන / මධ්‍ය කාලීන ණය ඒකාබද්ධ).

ශ්‍රී ලංකාවේ 2025 රාජ්‍ය ණය සේවාකරණ වියදම් දේශීය ණය බැඳීම්, විශේෂයෙන් භාණ්ඩාගාර බිල්පත් නිදහස් කිරීම් සහ භාණ්ඩාගාර බැඳුම්කර පොලී ගෙවීම් තුළ දැඩි ලෙස සංකේන්ද්‍රණය වී තිබිණි. විදේශ ණය සේවාකරණය සැලකිය යුතු මට්ටමක පැවති අතර එය මුළු ණය-සේවා පිරිවැයෙන් සියයට නවයකට ආසන්න ප්‍රමාණයක් දායක විය. දේශීය ඇපකර රජයේ මූල්‍යන සහ ආපසු ගෙවීමේ අවශ්‍යතාවල ප්‍රධාන ධාවක ලෙස අඛණ්ඩව පැවතිණි. ඵලදායී මුදල් ප්‍රවාහයේ සහ රාජ්‍ය ණය කළමනාකරණයේ වැදගත්කම ඉස්මතු කරමින්, වසර සඳහා මුළු ණය සේවා බර ප්‍රමාණය ආසන්න වශයෙන් රුපියල් ට්‍රිලියන 8.7 ක් විය.

### 2.3.3 ණය සංඛ්‍යාලේඛන සහ වාර්තාකරණ ඒකකය

මෙම කාල පරිච්ඡේදය තුළ, ණය දත්තවල අඛණ්ඩතාව සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීමේදී ණය සංඛ්‍යාලේඛන සහ වාර්තාකරණ ඒකකය විසින් ඉලක්ක කිහිපයක් අත්කර ගන්නා ලදි. :

- ශ්‍රී ලංකා මහ බැංකුවෙන් කාර්යයන් සාර්ථකව සංක්‍රමණය කිරීම :
  ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) සිට රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත අදාළ ණය වාර්තාකරණ ක්‍රමවේද සහ දත්ත බාධාවකින් තොරව සංක්‍රමණය කිරීම සහ සංක්‍රාන්තිය සිදු කරන ලදි. ණය පරිපාලනයේ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා අවශ්‍ය මෙහෙයුම් යටිතල පහසුකම් සහ දත්ත ප්‍රොටෝකෝල ස්ථාපනය කිරීම මෙයට ඇතුළත් විය.

- කාර්තුමය සංඛ්‍යාන ණය ප්‍රකාශනයේ (QSDB) වැඩිදියුණු කරන ලද අන්තර්ගතය, ව්‍යුහය සහ පෙනුම :
  රාජ්‍ය ණය තොරතුරු සඳහා වඩාත් විස්තරාත්මක දත්ත සහ වඩා පැහැදිලි බවක් කාර්තුමය සංඛ්‍යාන ණය ප්‍රකාශනය සඳහා වැඩිදියුණු කළ ආකෘතියක් සංවර්ධනය කර ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩිදියුණු කළ ප්‍රකාශනය මෙම කාලය තුළ සිව් වතාවක් සාර්ථකව ප්‍රකාශයට පත් කරන ලදි.

- වාර්තාකරණ ක්‍රමවේදයන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම :
  ණය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීම සහ ඉදිරිපත් කිරීම ප්‍රමිතිගත කිරීම සඳහා ව්‍යුහගත වාර්තාකරණ ක්‍රමවේදයන් සංවර්ධනය කරන ලදි. සියලුම දත්ත ඉල්ලීම් සඳහා ණය සංඛ්‍යාලේඛන සහ වාර්තාකරණ ඒකකය විසින් ඒකාකාර පිරිසැලසුමක් අනුගමනය කරන බවට සහතික කෙරෙන වෘත්තීය වාර්තාකරණ ආකෘතියක් නිර්මාණය කරන ලදි.

- වැඩිදියුණු කළ තොරතුරු බෙදා හැරීම :
  රාජ්‍ය ණය තොගය පිළිබඳ මාසික දත්ත, අර්ධ වාර්ෂික ණය වාර්තාව සහ ණය තොග වාර්තා සහ රජයේ ණය කළඹ පිළිබඳ මුදල් ප්‍රවාහ වාර්තා ඇතුළුව ප්‍රකාශන කාලරාමුවට අනුකූලව ණය සංඛ්‍යාලේඛන වාර්තා, ඒකකය විසින් ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩව සිදු කරන ලදි.

- මෙම කාලය තුළ ණය සංඛ්‍යාලේඛන සහ වාර්තාකරණ ඒකකය විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, පාර්ලිමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ලෝක බැංකුව වෙත කරන ලද ඉදිරිපත් කිරීම්ද, තොරතුරු දැන ගැනීමේ පනත යටතේ කරන ලද ඉල්ලීම්ද ඇතුළුව ආසන්න වශයෙන් දත්ත ඉල්ලීම් 110 ක කටයුතු සිදු කරන ලදි.

- ජූනි සහ දෙසැම්බර් මාසවල වසරකට දෙවරක් ණය දත්ත වාර්තාව ප්‍රකාශයට පත් කිරීම.

- ණය වාර්තා මාසිකව ප්‍රකාශයට පත් කිරීම.

- ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ෂික ආර්ථික සමාලෝචනය, මුදල් අමාත්‍යාංශයේ අවසාන අයවැය තත්ත්ව වාර්තාව, මුදල් අමාත්‍යාංශයේ මධ්‍ය කාලීන අයවැය තත්ත්ව වාර්තාව, අයවැය ආර්ථික හා මූල්‍ය තත්ත්ව වාර්තාව, වාර්ෂික අයවැය සකස් කිරීම, මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය ආදිය සඳහා තොරතුරු සපයන ලදි.

**<u>අනාගත ඉදිරි දැක්ම</u>**

ඉදිරිය දෙස බලන විට, ණය සංඛ්‍යාලේඛන සහ වාර්තා කිරීමේ හැකියාවන් තවදුරටත් ශක්තිමත් කිරීමට ණය සංඛ්‍යාලේඛන සහ වාර්තාකරණ ඒකකය කැපවී සිටී. ඉදිරි කාලය සඳහා පහත සඳහන් ඇරඹුම් හඳුනාගෙන ඇත:

- අන්තර්ක්‍රියාකාරී ණය සංඛ්‍යාලේඛන දර්ශන පුවරුවක් (Interactive Debt Statistics Dashboard) සංවර්ධනය කිරීම
  ණය කළඹ පිළිබඳ තත්‍ය කාලීන දත්ත කළමනාකරණයට සැපයීම සඳහා විස්තීර්ණ දර්ශන පුවරුවක් (Dash Board) සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියක ඒකකය වර්තමානයේ නියැලී සිටී.

- ප්‍රකාශන තවදුරටත් වැඩිදියුණු කිරීම
  කාර්තුමය සංඛ්‍යාන ණය ප්‍රකාශනයේ සහ අනෙකුත් සංඛ්‍යාලේඛන ප්‍රකාශනවල අන්තර්ගතය සහ තත්වය ඉදිරිපත් කිරීම අඛණ්ඩව වැඩිදියුණු කිරීමට සැලසුම් ක්‍රියාත්මක වේ.

- ජාත්‍යන්තර ප්‍රමිතීන් සමඟ පෙළගැස්වීම
  ණය සංඛ්‍යාලේඛනවල රාජ්‍ය මූල්‍ය සංඛ්‍යායන ප්‍රමිතීන් නවතම ගෝලීය යන භාවිතයන් ක්‍රමයෙන් අනුගමනය කිරීමට අඛණ්ඩ උත්සාහයන් ගනු ලැබේ.

- ධාරිතා සංවර්ධනය සහ පුහුණුව
  පරිණාමය වන වාර්තාකරණ ක්‍රමවේද සහ ප්‍රවණතා කළමනාකරණය කිරීමට අවශ්‍ය කුසලතාවන්ගෙන් කාර්ය මණ්ඩලය සන්නද්ධ කිරීම සඳහා උසස් පුහුණුවට ප්‍රමුඛත්වය දීමට පියවර ගනු ලැබේ.

# 3. 2025 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්යසාධනය

**3.1** මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ- එෆ්

| 2025 දෙසැම්බර් 31 න් අවසන් වූ කාල සීමාව සඳහා සමස්ථ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | | | | | |
|---|---|---|---|---|---|
| අයවැය | | සටහන | රුපියල් | | |
| | | | තත්‍ය | | |
| | | | 2025 | 2024 | |
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ -1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 97,210,000 | - | ඒසීඒ -3 |
| - | තැන්පතු | | 93,839 | - | ඒසීඒ -4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 1,884,508 | - | ඒසීඒ -5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **99,188,347** | **-** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **99,188,347** | **-** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණය (ඈ)** | | 51,305 | - | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ=(ඇ)-(ඈ)** | | **99,137,042** | **-** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | **-** | - | |
| 65,000,000 | වැටුප් වේතන, සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 59,101,305 | - | |
| 34,750,000 | අනෙකුත් භාණ්ඩ සහ සේවා | 6 | 12,615,415 | - | ඒසීඒ -2(ii) |
| 250,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම් | 7 | 157,815 | - | |

| | | | | | |
|---|---|---|---|---|---|
| - | පොලී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| **100,000,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **71,874,535** | **-** | |
| | **මූලධන වියදම්** | | | | |
| 10,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 10 | 1,308,262 | - | **ඒසීඒ -2(ii)** |
| 105,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 21,840,056 | - | |
| - | ප්‍රාග්ධන මාරු කිරීම් | 12 | | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | | - | |
| 10,000,000 | හැකියා වර්ධනය | 14 | 614,000 | - | |
| - | වෙනත් ප්‍රාග්ධන වියදම් | 15 | | - | |
| **125,000,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **23,762,318** | **-** | |
| | තැන්පත් ගෙවීම් | | 93,839 | | |
| | අත්තිකාරම් ගෙවීම් | | 11,353,939 | - | **ඒසීඒ -4** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම | | - | - | **ඒසීඒ -5** |
| | **ප්‍රධාන ලෙජරයේ වියදම් (ඌ)** | | **11,447,778** | **-** | |
| 225,000,000 | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 107,084,631 | - | |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ=(ඉ-එ)** | | **(7,947,589)** | **-** | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශය අනුව ශේෂය** | | (7,947,589) | **-** | **ඒසීඒ -7** |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | **-** | **-** | **ඒසීඒ -3** |
| | | | **-** | **-** | |

## **3.2** මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

ඒසීඒ-පී

**2025** දෙසැම්බර් **31** දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | තතා 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 21,840,056 | - |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 9,469,431 | - |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **31,309,487** | - |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම | | 9,469,431 | - |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 21,840,056 | - |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | - | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම** | | **31,309,487** | - |

පිටු අංක 7 සිට 27 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 28 සිට 34 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචනා සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2026.02.24 | දිනය : 2026.02.20 | දිනය : 2026.02.20 |
| ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම<br>මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්<br>මුදල් අමාත්‍යාංශය<br>කොළඹ - 01 | යූ. උඩුගහපත්තුව<br>අධ්‍යක්ෂ ජනරාල්<br>රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය<br>මහා භාණ්ඩාගාරය 2<br>කොළඹ - 01, ශ්‍රී ලංකාව | පී.ඩී.එම්. මුදිතා ගුණරත්න<br>ගණකාධිකාරී (වැ.බ.)<br>රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය<br>මහා භාණ්ඩාගාරය<br>කොළඹ - 01 |

## 3.3 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

ඒසීජ්-සී

**2025 දෙසැම්බර් 31 න් අවසන් වූ කාලසීමාව සඳහා**

**මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය**

| | තත්‍ය | |
|---|---|---|
| | 2025 | 2024 |
| | රුපියල් | රුපියල් |
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| මුළු බදු ලැබීම් | | |
| ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂයන් වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 2,569,786 | - |
| අග්‍රිම ලැබීම් | 97,210,000 | - |
| අත්තිකාරම් අය කර ගැනීම් | 7,410,028 | - |
| තැන්පතු ලැබීම් | 93,839 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකමවලින් ජනිත වූ මුදල ප්‍රවාහය (අ)** | **107,283,653** | - |
| **<u>අඩු කළා - මුදල් වැය කිරීම් :</u>** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 71,712,220 | - |
| සහනාධාර සහ මාරු කිරීම් | 157,815 | - |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම, මූලධන මාරු කිරීම, හැකියා වර්ධනය හා මූලධන වියදම් | 1,922,262 | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 151,857 | -- |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 51,305 | - |
| අත්තිකාරම් ගෙවීම් | 11,354,299 | - |
| තැන්පතු ගෙවීම් | 93,839 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **85,443,597** | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)= (අ)- (ආ)** | **21,840,056** | - |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | - | |
| පොළිය | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |

| | | |
|---|---|---|
| උප ණය අය කර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **-** | **-** |
| | | |
| <u>**අඩු කළා - මුදල් වැයකිරීම්:**</u> | | |
| මූලධන වත්කම් ඉදි කිරීම්, මිළදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් | 21,840,056 | **-** |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | 21,840,056 | **-** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)= (ඇ) - (ඉ)** | (21,840,056) | **-** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)= (ඇ)+ (ඊ)** | **-** | **-** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| <u>***අඩු කළා - මුදල් වැයකිරීම් :***</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම | - | - |
| **මූල්‍යය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ) = (ඌ) - (එ)** | **-** | **-** |
| | - | - |
| **මුදල්වල ශුද්ධවෙනස්වීම් (ඕ)= (උ) + (ඒ)** | | |
| **ජනවාරි 01 වෙනි දිනට ආරම්භක ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 වෙනි දිනට අවසන් ශේෂය** | **-** | **-** |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

වාර්තාකරණයේ පදනම

1) සැකසීමේ අරමුණ

රජයේ මුදල් රෙගුලාසි 150 සහ 151 සහ 2025.12.17 දිනැති අංක 02/2025 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයට අනුව මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

2) වාර්තා කිරීමේ කාලය

මෙම මූල්‍ය ප්‍රකාශ සඳහා වාර්තා කිරීමේ කාලය 2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ සකසා ඇත්තේ ඇතැම් වත්කම් නැවත තක්සේරු කිරීමෙන් වෙනස් කරන ලද ඓතිහාසික පිරිවැය මත වන අතර වෙනත් ආකාරයකින් නිශ්චිතව දක්වා නැත්තේ නම් වෙනස් කරන ලද මුදල් පදනමක් මත ගිණුම්ගත කර ඇත.

මූල්‍ය ප්‍රකාශයන්ගේ සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට වටයා ඉදිරිපත් කර ඇත.

4) ආදායම හඳුනා ගැනීම

අදාළ ආදායම් කාල සීමාව හැර ගිණුම්කරණ කාල සීමාව තුළදී මුදල් ලැබීම් මත විනිමය සහ විනිමය නොවන ආදායම් හඳුනා ගනු ලැබේ.

5) දේපල, පිරියත සහ උපකරණ හඳුනා ගැනීම සහ මිණුම්කරණය (PP&E)

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ගලා ඒමට අවකාශ ඇති විටත්, වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි විටත්, දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් හඳුනා ගැනේ.

දේපල, පිරියත සහ උපකරණ මනිනු ලබන්නේ පිරිවැයකින් වන අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවේදී නැවත ඇගයීමේ ආකෘතිය භාවිත කරනු ලැබේ.

6) දේපල, පිරියත සහ උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපල පිරියත සහ උපකරණවල අනුරූප ගිණුමයි.

7) මුදල් සහ මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 වන දිනට අත ඇති දේශීය මුදල් නෝට්ටු සහ කාසි මුදල් සහ මුදල් සමාන දෑවලට ඇතුළත් වේ

### 3.5 ප්‍රතිපාදන භාවිත කිරීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | ප්‍රතිපාදන භාවිතය අවසන් ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ආරම්භක | අවසන් | | |
| පුනරාවර්තන | 100,000,000 | 100,000,000 | 71,874,535 | 72% |
| ප්‍රාග්ධන | 125,000,000 | 125,000,000 | 23,762,318 | 19% |

### 3.6 මූල්‍යමය නොවන වත්කම් වාර්තාකරණයේ කාර්යසාධනය

| වත්කම් සංකේතය | සංකේත විස්තරය | භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව 2025.12.31 දිනට ශේෂය | මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව **2025.12.31** දිනට ශේෂය | ගිණුම්ගත කිරීමට පවතින | වාර්තාකරණ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස ( %) |
|---|---|---|---|---|---|
| 9152 | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | | 21,840,056 | | |

## 3.7 විගණකාධිපති වාර්තාව

2025 දෙසැම්බර් 31 ට විගණකාධිපති විසින් නිකුත් කරන ලද අවසන් විගණන වාර්තාව මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම - 1)

## 4. කාර්ය සාධන දර්ශක

| දර්ශකය | තත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | | |
|---|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% | 50% ට අඩු |
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරිමේ ප්‍රගතිය % | | | √ | |
| වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරිමේ ප්‍රගතිය % | | | | √ |
| පුනරාවර්තන වියදම්වල (භෞතික සහ මූල්‍ය) ප්‍රගතිය % | | | √ | |
| ප්‍රාග්ධන වියදම්වල (මූල්‍ය) ප්‍රගතිය % | | | | √ |
| ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම්වල සාරාංශය % | | | | √ |

සටහන - රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය (PDMO) ස්ථාපිත කර, 2024.12.02 දින ආයතනයේ කාර්ය මණ්ඩල පුහුණුව සහ ණය කළමනාකරණ මෙහෙයුම් අරඹන ලදි. 2025 වසර තුළ, මෙහෙයුම් සහ මානව සම්පත් ධාරිතාව වැඩි දියුණු කරමින් රාජ්‍ය ණය කළමනාකරණ පනතට අනුව ණය කළමනාකරණ මෙහෙයුම් ක්‍රමයෙන් සිදු කරන ලදි. 2025 දෙසැම්බර් මස මුල් භාගය වන විට, ශ්‍රී ලංකා මහ බැංකුව රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙතින් ණය කළමනාකරණ කාර්යයන් සංක්‍රමණය කිරීමේ බොහෝ කටයුතු රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් සම්පූර්ණ කර තිබුණි.

### 5. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ කාර්ය සාධනය

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය (PDMO) සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ දිගුකාලීන සංවර්ධනයට සහාය වන වගකිවයුතු, විනිවිද පෙනෙන සහ තිරසාර රාජ්‍ය ණය භාවිතයන් ප්‍රවර්ධනය කිරීමෙන් ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සඳහා දායක වේ. රජයේ ණය කළමනාකරණය, ණය බැඳුම්කර නිකුත් කිරීම සහ කළමනාකරණය කිරීම, ණය දීමේ මෙහෙයුම් කළමනාකරණය, ආයෝජක සබඳතා, ප්‍රතිපත්ති විශ්ලේෂණය, අවදානම් කළමනාකරණය, ණය සේවාකරණය, සටහන් කිරීම සහ රාජ්‍ය ණය වාර්තා කිරීම යන රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයෙහි මූලික කාර්යයන් පහත සඳහන් තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ ඍජුව සහ වක්‍රව පෙළගැසී ඇත.

**තිරසාර සංවර්ධන ඉලක්ක 04 : ඇතුළත් සහ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ආයු කාලය පුරාම ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම**

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයෙහි මූලික වගකීම මූල්‍ය කළමනාකරණය සහ ණය අධීක්ෂණය වුවද, අධ්‍යාපනයටත්, ජීවිත කාලය පුරාම ඉගෙනීමේ ඇරඹුම් සඳහාත් සම්පත් සැපයීමෙන් එහි ක්‍රියාකාරකම් වක්‍රව අධ්‍යාපනයට සහාය වේ.

**තිරසාර සංවර්ධන ඉලක්ක 06: සැමට ජලය සහ සනීපාරක්ෂාව ලබා දීම සහ තිරසාර කළමනාකරණය සහතික කිරීම**

රාජ්‍ය ණය විචක්ෂණශීලීව කළමනාකරණය කිරීමෙන් සහ තිරසාර මූල්‍යනය සහතික කිරීමෙන්, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘති සඳහා දායක වන අතර, මෙම අත්‍යවශ්‍ය සේවාවන්වල පැවැත්ම සහ තිරසාරබව සහතික කරන යටිතල පහසුකම් සඳහා අරමුදල් ලබා ගැනීමට රජයට උපකාරී වේ.

**තිරසාර සංවර්ධන ඉලක්ක 07: සැමට දැරිය හැකි, විශ්වාසදායක, තිරසාර සහ නවීන බලශක්තිය සඳහා ප්‍රවේශය සහතික කිරීම**

නිසි ණය කළමනාකරණය සහ රජයේ මූල්‍යනයට පහසුකම් සැලසීම මගින්, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය නවීන, තිරසාර බලශක්ති යටිතල පහසුකම්වල ආයෝජන සඳහා සහාය වන අතර, පාරිසරික වශයෙන් වගකිවයුතු සංවර්ධනය ප්‍රවර්ධනය කරමින් පුරවැසියන්ට දැරිය හැකිවූත්, විශ්වාසදායකවූත් බලශක්තිය සඳහා ප්‍රවේශය සහතික කරයි.

**තිරසාර සංවර්ධන ඉලක්ක 8: යහපත් වැඩ සහ ආර්ථික වර්ධනය**

පිරිවැය ඵලදායී සහ කාර්යක්ෂම ණය කළමනාකරණය සහතික කිරීමෙන්, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය ආර්ථික වර්ධනය, ආයෝජන විශ්වාසය සහ රැකියා උත්පාදනය සඳහා සහාය වන ස්ථාවර සාර්ව ආර්ථික පරිසරයකට දායක වේ.

**තිරසාර සංවර්ධන ඉලක්ක 9: කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම් (වක්‍ර දායකත්වය)**

තිරසාර මූල්‍යනය සුරක්ෂිත කිරීමෙන් සහ ණය අවදානම් අඩු කිරීමෙන්, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය යටිතල පහසුකම් නවීකරණය සහ කාර්මික සංවර්ධනය සඳහා ආයෝජනය කිරීමට රජයේ ධාරිතාවයට වක්‍රව සහාය වේ.

**තිරසාර සංවර්ධන ඉලක්ක 13: දේශගුණික ක්‍රියාමාර්ග (වක්‍ර දායකත්වය)**

වගකිවයුතු ණය පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සහ දේශගුණය හා සම්බන්ධ මූල්‍ය උපකරණ (උදා: හරිත බැඳුම්කර) වෙත ප්‍රවේශය පහසු කිරීම මගින්, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාර සංවර්ධන ඇරඹුම් සඳහා අරමුදල් රැස් කිරීමට රජයට ඇති හැකියාවට රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සහාය වේ.

**තිරසාර සංවර්ධන ඉලක්ක 16: සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන**

රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීම මගින් විනිවිදභාවය, වගවීම සහ ආයතනික ස්වාධීනත්වය මඟින් රාජ්‍ය මූල්‍ය පාලනය ශක්තිමත් කරයි. නිතිපතා ණය වාර්තා කිරීම, අනුකූලතා යාන්ත්‍රණ සහ වැඩිදියුණු කරන ලද අධීක්ෂණය රාජ්‍ය ආයතන කෙරෙහි ඇති විශ්වාසය අවධාරණය කරයි.

**තිරසාර සංවර්ධන ඉලක්ක 17: ඉලක්ක සඳහා හවුල්කාරිත්වයන්**

ජාත්‍යන්තර මූල්‍ය ආයතන, සංවර්ධන හවුල්කරුවන් සහ දේශීය හා විදේශීය ආයෝජකයින් සමඟ ක්‍රියාකාරී සම්බන්ධතාව මගින්, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය මූල්‍ය සහයෝගීතාව වැඩි දියුණු කරන අතර ජාතික සංවර්ධන ප්‍රමුඛතාවන්ට සහාය වීම සඳහා තිරසාර මූල්‍යන බලමුලු ගන්වයි.

# 6. මානව සම්පත් පැතිකඩ

### 6.1 කාර්ය මණ්ඩල කළමනාකරණය

2025 දෙසැම්බර් 31 වෙනි දිනට කාර්ය මණ්ඩල තත්ත්වය

| මට්ටම | අනුමත කාර්ය මණ්ඩලය | පවත්නා කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 40 | 29 | 11 |
| තෘතීයික | 03 | 02 | 01 |
| ද්විතීයික | 24 | 13 | 11 |
| ප්‍රාථමික | 10 | 05 | 05 |
| **එකතුව** | **77** | **49** | **28** |

### 6.2 ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි මානව සම්පත් හිඟයේ හෝ අතිරික්තයේ බලපෑම

ආයතනයේ සේවා අවශ්‍යතා කළමනාකරණය කරන ලද්දේ පවතින සේවක සංඛ්‍යාව සමඟිනි.

### 6.3 මානව සම්පත් සංවර්ධනය

දෙපාර්තමේන්තු සේවකයින්ගේ දැනුම, කුසලතා සහ ධනාත්මක ආකල්ප වැඩිදියුණු කිරීම සඳහාත්, ආයතනික ඉලක්ක සපුරාලීමට කැපව සිටින, දෙපාර්තමේන්තු සේවකයින්ගේ ධනාත්මක පෞරුෂත්ව වර්ධනය කිරීම සඳහාත් දේශීය හා විදේශීය පුහුණුව ලබා දීම වැදගත් වේ. ඒ අනුව, 2025 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට පහත සඳහන් දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් ලබා දෙන ලදි.

| වැඩසටහනේ නම | කාර්ය මණ්ඩලයේ පුහුණු කරන ලද සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | මුළු ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (විදේශීය / දේශීය) | නිපැයුම / ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ණය හා සම්බන්ධ මූල්‍ය අවදානම ඇගයීම හා කළමනාකරණය | 1 | 05.02.2025 02.03.2025 | √ | | විදේශීය | |
| රාජ්‍ය ව්‍යවසායක ණය සහ සුරැකුම්පත්වල ණය අවදානම කළමනාකරණය සහ ඇගයීම | 3 | 13.04.2025 20.04.2025 | √ | | විදේශීය | |
| රාජ්‍ය ණය විනිවිදබව පිළිබඳ සම්මන්ත්‍රණය : යහ පිළිවෙත් සහ නීතියට අනුකූලව | 1 | 13.05.2025 17.05.2025 | √ | | විදේශීය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ණය වාර්තාකරණයේ හා අධීක්ෂණයේ මූලික කරුණු | 5 | 17.08.2025<br>23.08.2025 | √ | | විදේශීය | |
| මධ්‍ය කාලීන ණය කළමනාකරණ ක්‍රමෝපාය සැකසීම - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල / SARTTAC | 15 | 25.08.2025<br>28.08.2025 | √ | | ශ්‍රී ලංකාව | |
| මධ්‍ය කාලීන ක්‍රමෝපාය පදනම් කර ගත් ණය කළමනාකරණය - (MTDS ඇතුලත්ව) | 2 | 06.09.2025<br>16.09.2025 | √ | | විදේශීය | |
| ශ්‍රී ලංකා මහ බැංකු පුහුණුව | 3 | 01.09.2025<br>30.09.2025 | √ | | දේශීය | |
| ණය කළමනාකරණයේ ප්‍රමාණාත්මක ක්‍රම - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 5 | 05.10.2025<br>11.10.2025 | √ | | විදේශීය | |
| සේවාස්ථ පුහුණුව | 3 | 13.10.2025<br>30.11.2025 | √ | | දේශීය | |
| ස්වෛරී ණය කළමනාකරණය පිළිබඳ ආසියානු සංවර්ධන බැංකුවේ වැඩමුළුව | 8 | 13.11.2025<br>15.11.2025 | √ | | දේශීය | |
| පොදු රාජ්‍ය මණ්ඩලීය උච්චස්ථාන පුහුණුව | 6 | 22.11.2025<br>07.12.2025 | √ | | විදේශීය | |
| ණය වාර්තාකරණය, ණය සටහන් කිරීම සහ ආයෝජක සබඳතා - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 2 | 01.12.2025<br>05.12.2025 | √ | | විදේශීය | |

07 . අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යකරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූලවේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූලවේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූලවේ. | | |
| 1.6 | වෙනත් | - | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.7 | වට්ටෝරු භාණ්ඩ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබිම | අනුකූලවේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූලවේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූලවේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේදී ගිණුම් පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූලවේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකසා ඇත. | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකසා ඇත. | අනුකූලවේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකසා ඇත. | අනුකූලවේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කර ඇත. | අනුකූලවේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. | අනුකූලවේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී ඇත. | අනුකූලවේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මුදල් රෙගුලාසි 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ජා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර තිබිණි. | අනුකූලවේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබිණි. | අනුකූලවේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබිණි. | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබිණි. | අනුකූලවේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබිණි. | අනුකූලවේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබිණි. | අනුකූලවේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන ජේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කරන ලදි. | අනුකූලවේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබිණි. | අනුකූලවේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කරන ලදි. | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.5 | ගර්හිත භාණ්ඩ මු.රෙ. 772 ප්‍රකාරව අපහරණය කර තිබිණි. | අනුකූලවේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබිණි. | - | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබිණි. | - | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් තිබිණි. | අනුකූලවේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කර ඇත. | - | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කර ඇත. | අනුකූලවේ | | |
| 9.6 | කල් බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබිණි. | අනුකූලවේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබිණි. | අනුකූලවේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබිණි. | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබිණි. | අනුකූලවේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් කර තිබිණි. | අනුකූලවේ | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළඹ තිබිණි. | අනුකූලවේ | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වි තිබිණි. | අනුකූලවේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබිණි. | අනුකූලවේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබිණි. | අනුකූලවේ | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු ඉවත් කිරීම සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබිණි. | අනුකූලවේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් තිබිණි. | අනුකූලවේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබිණි. | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබිණි. | අනුකූලවේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබිණි. | අනුකූලවේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කර තිබිණි. | අනුකූලවේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කර තිබිණි. | අනුකූලවේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබිණි. | අනුකූලවේ | | |
| 15.3 | මු.රෙ 176 ප්‍රකාරව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත. | අනුකූලවේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන ගොස් තිබිණි. | අනුකූලවේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී ඇත. | අනුකූලවේ | | |
| 16.3 | 2017.09.20 දිනැති කළමනාකර සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා එම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබිණි. | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලැබේ. | අනුකූලවේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා හෝ වෙනත් විකල්ප මාර්ගයන් හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පළ කිරීමට පහසුකම් සලසා ඇත. | අනුකූලවේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව ද්වී වාර්ෂික හෝ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර ඇත. | අනුකූලවේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර ඇත. | - | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට ඇත. | - | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට ඇත. | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට ඇත. | අනුකූලවේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර ඇත. | අනුකූලවේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ අංක 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා ගොඩ නැංවීමේ වැඩසටහන් සංවිධානය කිරීම සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්විම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෝෂ්ඨ නිලධාරියෙකු පත් කරන ලදි. | අනුකූලවේ | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වාදි ඇති අඩුපාඩු නිවැරදි කොට ඇත. | | | |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : පීඩීඩී/ඒ/පීඩීඑමඕ/එෆ්ඒ/2025/20   ඔබේ අංකය / உமது இல. / Your No. :   දිනය / திகதி / Date : 2026 ජුනි 08 දින

ගණන් දීමේ නිලධාරී
රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

**ශීර්ෂය -338 රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

**1.** මූල්‍ය ප්‍රකාශන

**1.1** මතය

ශීර්ෂය - 338 රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී නිලධාරී දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2024 ජුනි 18 වන දින සම්මත කර 2024 නොවැම්බර් 25 වන දින සිට බලාත්මක වූ 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත බලාත්මක කිරීමෙන් පසුව, 2024 දෙසැම්බර් 02 වන දින රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය ස්ථාපිත කර තිබුණි. ඒ අනුව, මෙම කාර්යාලය විසින් 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල් වරට මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණු බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තියේ අවශ්‍යතාවය අදාළ නොවිණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයන් 03 ක් හා මූලධන වැය විෂයන් 02 ක් සඳහා වෙන් කරන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදනය වන රු.74,550,000 ක් සමාලෝචිත වර්ෂය තුළදී වැය නොකර සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 17 ක් සහ මූලධන වැය විෂයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් වර්ෂය තුළ ප්‍රතිපාදන උපයෝජනය කළ පසු රු.54,795,869 ක ඉතිරියක් පැවති අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 සිට සියයට 98 අතර පරාසයක පැවති බව නිරීක්ෂණය විය.

### 3.2 බැරකම් හා බැඳීම් වලට එළඹීම

සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය යුතුව තිබූ එකතුව රු.198,161 ක් වූ බැරකම 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර භාණ්ඩාගාර මුද්‍රිත SA 92 හි හා සමාලෝචිත වර්ෂයේ බැරකම් ලේඛනයේද සටහන් කර නොතිබුණි.

### 3.3 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 30/2016 ප්‍රකාරව සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12 ක කාලසීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත් ආයතනය විසින් පරිහරණය කරනු ලබන වාහන 03 කට අදාළව ඉන්ධන දහන පරීක්ෂාවන් 2025 දෙසැම්බර් 31 දින දක්වා සිදු කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 විදේශ ණය සහ ප්‍රදාන ලබා ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව 2025 වර්ෂයේ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සහ සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම පහත පරිදි වේ.

| සංවර්ධන පාර්ශවකරුවන් | ප්‍රතිලබ්ධි ඇස්තමේන්තු ප්‍රදාන ඇතුලත්ව (එ.ජ.ඩො. මිලියන) | සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම ප්‍රදාන ඇතුලත්ව (එ.ජ.ඩො මිලියන) | විචලනය (එ.ජ. ඩො මිලියන) | විචලනය, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස ( %) |
|---|---|---|---|---|
| ලෝක බැංකුව | 331 | 169 | (162) | (49) |
| ආසියානු සංවර්ධන බැංකුව | 504 | 517 | 13 | 3 |
| චීනය | 42 | - | (42) | (100) |
| ජපානය | 97 | 19 | (78) | (80) |
| කොරියාව | 13 | 1 | (12) | (92) |
| මැද පෙරදිග රටවල් | 70 | - | (70) | (100) |
| ඉන්දියාව | 65 | 13 | (52) | (80) |
| රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් | 37 | 3 | (34) | (92) |
| International Fund for Agriculture Development | 26 | 4 | (22) | (86) |
| ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | 24 | 40 | 16 | 67 |
| IMF | - | 682 | 682 | - |
| International Bank for Reconstruction and Development | - | 32 | 32 | - |
| European Investment Bank | - | 9 | 9 | - |
| Saudi Fund for Arab Economic Development | - | 21 | 21 | - |
| OPEC | - | 64 | 64 | - |
| | **1,207** | **1,574** | **365** | |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2025 වර්ෂයේ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ මුළු වටිනාකම එ.ජ.ඩො මිලියන 1,207 ක් වුවද, සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම එ.ජ.ඩො මිලියන 1,574 ක් වීම හේතුවෙන් සත්‍ය උපලබ්ධි වටිනාකම, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට වඩා එ.ජ.ඩො මිලියන 365 කින් එනම් සියයට 30 කින් පමණ වැඩි වී තිබුණි.

(ii) ආසියානු සංවර්ධන බැංකුව සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව යන සංවර්ධන පාර්ශවකරුවන්ගෙන් ලබා ගත් ණයවල සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සමඟ සසඳන විට, පිළිවෙලින් සියයට 3 කින් සහ 67 කින් වැඩි වී තිබුණි.

(iii) ලෝක බැංකුව, ජපානය, කොරියාව, ඉන්දියාව, IFAD හා රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් වලින් ලබා ගැනීමට අපේක්ෂා කල ණය ලබා ගැනීම් පිළිවෙලින් සියයට 49, 80, 92, 80, 86 හා 92 කින් අඩු වී තිබුණි.

(iv) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ පැවති එකඟතාවය අනුව ප්‍රතිලබ්ධි ලැබෙන බව අපේක්ෂා කළ හැකිව තිබුණද, සමාලෝචිත වර්ෂයේ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට එය ඇතුළත් කර නොතිබුණි.

(ආ) රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 26 (II) හි පැවති ණය ශේෂ සහ ණය කළමනාකරණ පද්ධතියේ Stock and Flow Report No. 01 හි අන්තර්ගත ශේෂ අතර 2024 දෙසැම්බර් 31 දිනට ණය ලබා ගැනීම් 03 කට අදාළව රු.මිලියන 1,070 ක වෙනසක් හෙවත් ගිණුම්ගත නොකළ ප්‍රතිලබ්ධිවීම් පවතින බව 2024 වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශන වල Explanatory Note 02 යටතේ හෙළිදරව් කර තිබූ අතර ඒ බව එවකට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ද තහවුරු කර තිබුණි.

(i) එසේ වුවද, 2025 ජනවාරි 01 දිනට ණය කළමනාකරණ පද්ධතියේ Stock and Flow Report No. 01 හි ආරම්භක ශේෂයන් සහ 2024 දෙසැම්බර් 31 දිනට වූ විගණිත රජයේ මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 26(II) හි ශේෂයන් සන්සන්දනය කිරීමේදී ශුද්ධ වශයෙන් රු.මිලියන 2,672 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව, ඉහත දක්වා ඇති ගිණුම්ගත නොකළ ණය ශේෂ වලට අමතරව තවදුරටත් 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ වුවත් එදිනට ණය කළමනාකරණ පද්ධතියේ Stock and Flow Report No. 01 හි හෝ රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් නොවූ ප්‍රතිලබ්ධිවීම් පැවතිය හැකි බව නිරීක්ෂණය විය. ඒ අනුව, මෙම ණය ප්‍රතිලබ්ධිවීම්වල නිවැරදි ප්‍රතිලබ්ධි කාල පරිච්ඡේදය කුමක්ද යන්න ගැටළු සහගත විය.

(ii) රජයේ මූල්‍ය ප්‍රකාශනවල වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ වියදම් හඳුනාගැනීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව, සියළුම වියදම්, ගෙවීම් සිදු කර ඇති කාලසීමාව තුළ ගිණුම්ගත කර ඇති බව දක්වා තිබුණ ද, මෙලෙස ණය කළමනාකරණ පද්ධතියේ Stock and Flow Report No. 01 වාර්තාවේ ආරම්භක ශේෂ වලට ගළපා ඇති ප්‍රතිලබ්ධිවීම් වලට අදාළව සිදු කරන ලද වියදම් සමාලෝචිත වර්ෂයට අදාළ වේද යන්න විගණනයේ දී ප්‍රශ්නගත කරුණක් විය. මෙම ණය ලබා ගැනීම් සම්බන්ධයෙන් ණය පොළිය ගණනය කළ යුත්තේ කුමන කාලපරිච්ඡේදයකට අදාළවද යන්න තවදුරටත් ප්‍රශ්නගත කරුණක් විය.

(iii) 2025 වර්ෂය තුළ උපලබ්ධි වූ නමුත් 2025 වර්ෂය තුළ ගිණුම්ගත නොකළ විදේශ ණය ප්‍රතිලබ්ධිවීම් නොමැති බව අංක TOD/FD1/1/7/vol- vii සහ 2026 මාර්තු 03 දිනැති ලිපිය මඟින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තහවුරු කර තිබුණි. එසේ වුවද ඉහත දක්වා ඇති සිදුවීම පරිදි

2025 වර්ෂය තුළ දී ප්‍රතිලබ්ධි වූ නමුත් ණය කළමනාකරණ පද්ධතියේ Stock and Flow Report No. 01 හි හෝ රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් නොවී පවතින ගිණුම්ගත නොකළ ප්‍රතිලබ්ධිවීම් පැවතීමේ ඉහළ විභවතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 26 (ii) හි International Monetary Fund (IMF) යටතේ 740 වන අනු අංකය යටතේ ණය අංකයක් රහිතව Rapid Financing Instrument Arrangement Under Sri Lanka's 2023 – 26 IMF EFF Programme SDR 150.5 Mn ලෙස සඳහන් කර ප්‍රවර්තන වර්ෂය තුළ ණය ලබා ගැනීම් ලෙස SDR 150,500,000 හෙවත් රු.63,631,601,775 ක් දක්වා තිබුණු අතර 2025 දෙසැම්බර් 31 දිනට එම ණය මුදලෙහි ශේෂය SDR 150,500,000 හෙවත් රු.63,892,863,650 වී තිබුණි. එසේ වුවද, ණය කළමනාකරණය කරන පද්ධතියේ 2025 දෙසැම්බර් 31 දිනට Stock and Flow Report No. 01 හි එවැනි ණය ලබා ගැනීමක් සහ අවසාන ණය ශේෂයක් නිරීක්ෂණය නොවීය. රජයේ මූල්‍ය ප්‍රකාශන සඳහා විදේශීය ණය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට උපයෝගී කර ගනු ලබන මූලාශ්‍ර පද්ධතියේ 2025 දෙසැම්බර් 31 දිනට මෙම ණය වාර්තා නොවීම ප්‍රශ්නගත කරුණක් විය.

(ඇ) ණය ගිවිසුම් 06 කට අදාළව ණය කළමනාකරණ පද්ධතියේ Stock and Flow Report No. 01 වාර්තාව අනුව 2024 දෙසැම්බර් 31 දිනට සහ 2025 ජනවාරි 01 දිනට අදාළ ණය ශේෂයන් අතර ශුද්ධ වශයෙන් රු.2,672,687,312 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඉ) ණය කළමනාකරණ පද්ධතියේ Stock and Flow Report No. 01 වාර්තාවෙහි පමණක් ණය ගිවිසුම් 04 කට අදාළව EUR 1,161 ක් හෙවත් රු.422,432 ක සෘන ණය ශේෂ පවතින බව නිරීක්ෂණය විය.

(ඊ) ණය කළමනාකරණ පද්ධතියේ Stock and Flow Report No. 01 වාර්තාව හා රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 26 (II) හි සමාලෝචිත වර්ෂයේ ප්‍රතිලබ්ධිවීම් සංසන්දනය කිරීමේදී විදේශ ව්‍යවහාර මුදල් වටිනාකම සමාන වුවද දේශීය ව්‍යවහාර මුදල් වටිනාකම සමාන නොවන අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

(i) ණය ගිවිසුම් 12 කට අදාළව ප්‍රතිලබ්ධිවීම් වල වටිනාකම් එකතුව රු.53,090,930 කින් Stock and Flow Report No. 01 වාර්තාවේ වැඩියෙන් දක්වා තිබූ බව නිරීක්ෂණය විය.

(ii) ණය ගිවිසුම් 17 කට අදාළව ප්‍රතිලබ්ධිවීම් වල වටිනාකම් එකතුව රු.359,226,637 කින් රජයේ මූල්‍ය ප්‍රකාශන වල වැඩියෙන් දක්වා තිබූ බව නිරීක්ෂණය විය.

(iii) මේ හේතුවෙන් රජයේ මූල්‍ය ප්‍රකාශනවල සහ Stock and Flow Report No. 01 වාර්තාවේ මෙම ණය ගිවිසුම්වලට අදාළව ගණනය කර ඇති විදේශ විනිමය හුවමාරු අලාභය ද එකිනෙකට වෙනස් අගයන් ගන්නා බව නිරීක්ෂණය විය.

( උ) ණය ගිවිසුම් 02 කට අදාළව රජයේ මූල්‍ය ප්‍රකාශනවල සහ Stock and Flow Report No. 01 වාර්තාවේ එකතුව USD 266,000 හෙවත් රු.79,970,106 ක සෘන ණය ප්‍රතිලබ්ධිවීම් නිරීක්ෂණය විය.

(ඌ) රජයේ මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 26(iv) හි සඳහන් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වල දක්වා ඇති ණය අංක 2024347 ට අදාළව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) Stock and Flow Report No. 01 වාර්තාව අනුව 2025 ජනවාරි 01 දිනට එම ණය අංකයට අදාළ ආරම්භක ශේෂය USD 1,532,393,789 ක් හෙවත් රු.448,352,831,688 ක් වුවත් රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එදිනට ආරම්භක ශේෂය USD 1,543,566,908 ක් හෙවත් රු.451,621,899,582 ක් විය. ඒ අනුව USD 11,173,119 ක් හෙවත් රු.3,269,067,894 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ii) Stock and Flow Report No. 01 වාර්තාව අනුව මෙම ණය ශේෂයට අදාළව USD 329,547,051 ක් හෙවත් රු.98,404,430,238 ක් ප්‍රවර්තන වර්ෂය තුළ ගෙවීම් කර ඇති බව දක්වා තිබුණද රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවීම් කළ වටිනාකම USD 340,720,170 ක් හෙවත් රු.101,863,016,565 ක් විය. ඒ අනුව, USD 11,173,119 ක හෙවත් රු.3,458,586,327 ක වෙනසක් නිරීක්ෂණය විය.

(එ) විදේශීය ණය අංක 2014027 ට අදාළව රජයේ මූල්‍ය ප්‍රකාශන සහ Stock & Flow Report 01 අනුව 2025 දෙසැම්බර් 31 දිනට ණය ශේෂය USD 12,554,350 ක් වුවද, ණය ශේෂ සනාථන ලිපි අනුව එය USD 5,570,304 ක් වී තිබුණි. ඒ අනුව, USD 6,984,046 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඒ) අංක 2016021 හා 2016039 දරන විදේශීය ණය ශේෂයන් ට අදාළව, රජයේ මූල්‍ය ප්‍රකාශන සහ Stock & Flow Report 01 අනුව 2025 දෙසැම්බර් 31 දිනට ණය ශේෂය පිළිවෙලින් EURO 1,171,957 ක් හා 1,999,452 ක් වුවද, ණය ශේෂ සනාථන ලිපි අනුව එය පිළිවෙලින් EURO 1,180,132 ක් හා 2,012,375 ක් වී තිබුණි. ඒ අනුව, එකතුව EURO 21,098 ක් වූ වෙනසක් නිරීක්ෂණය විය.

## 4.2 විදේශ ණය පොළී වරදවා තෙවන පාර්ශවයකට ගෙවීම් කිරීම

විදේශීය ණය ලබා ගැනීම් 04 කට අදාළව සමාලෝචිත වර්ෂය තුළදී ණය පොළී ගෙවීමේදී USD 1,091,419 හෙවත් රු.මිලියන 333 ක් ණය හිමියන් නොවන තෙවන පාර්ශවයකට ගෙවීම් කර තිබූ බව මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් හඳුනාගෙන තිබුණි. මෙම වටිනාකම රජයේ මූල්‍ය ප්‍රකාශන වල විදේශීය ණය පොළී වියදම තුළ ඇතුළත් වී තිබුණි. තවද, 2026 ජනවාරි මාසයේද USD 1,418,011 ක් එලෙස තෙවන පාර්ශවයකට ගෙවා තිබූ අතර ඒ අනුව, තෙවන පාර්ශවයකට කරන ලද මුළු ගෙවීම USD 2,509,430 ක් වී තිබුණි.

## 4.3 විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය

සමාලෝචිත වර්ෂයේදී විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමස්තයක් ලෙස ගත් කළ 2025 ජනවාරි 01 දිනට පැවති ණය ගිවිසුම් 87 කට අදාළව JPK 351,743,684 ක ණය ශේෂ, ණය ගිවිසුම් 21 කට අදාළව පැවති USD 1,057,951,459 ක ණය ශේෂ, ණය ගිවිසුම් 37 කට අදාළව පැවති EUR 373,148,309 ණය ශේෂ සහ ණය ගිවිසුම් 10 කට අදාළව පැවති SAR 507,777,850 ක ණය ශේෂ ප්‍රතිව්‍යුහගතකරණයෙන් අනතුරුව පිළිවෙලින් JPK 354,944,802, USD 1,111,947,473, EUR 388,823,987 සහ SAR 516,951,065 ලෙස JPK 3,201,117 කින් ද USD 53,996,013 කින් ද , EUR 15,675,678 කින් ද සහ SAR 9,173,214 කින් ද ඉහළ ගොස් තිබුණි.

(ආ) විදේශීය ණය දෙන ආයතන 28 කින් ලබා ගත් 2025 දෙසැම්බර් 31 දිනට රු.474,513,444,708 වන ණය ශේෂයන්ට අදාළව ණය ගිවිසුම් 185 ක් 2025 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට යොමු කිරීමට නියමිතව තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල අයවැය කාර්යසාධන සහ හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රකාශයේ සටහන් අංක 11 අනුව, විදේශීය ණය ආපසු ගෙවීම (ණය පොළී හැර) රු.මිලියන 424,482 ක් ලෙස වාර්තා වී තිබුණි. රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයෙන් ලද CS-DRMS Report 724 වාර්තාවට අනුව, ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද ණය ආපසු ගෙවීම් ආරම්භ කරනු ලබන 2028 වර්ෂයේදී විදේශීය ණය ආපසු ගෙවීම (ණය පොළී හැර) රු.මිලියන 664,523 ක් විය හැකි බව දක්වා තිබුණි. ඒ අනුව, 2026 පෙබරවාරි 28 දින වන විට ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද ණය ද ඇතුලත්ව සමාලෝචිත වර්ෂයට සාපේක්ෂව 2028 වර්ෂයේදී ණය වාරික ගෙවීම (ණය පොළිය හැර) රු.මිලියන 240,042 කින් හෙවත් සියයට 57 කින් පමණ ඉහළ යා හැකි බව නිරීක්ෂණය විය.

## 4.4 භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි

(අ) ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි පිළිබඳව ලබා ගන්නා ලද ශේෂ සනාථන ලිපි වලට අනුව, රාජ්‍ය බැංකුවක් වෙත රු.මිලියන 2,399.99 ක භාණ්ඩාගාර ඇපකර 03 ක් ලබා දී තිබුණද, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඒ වෙනුවෙන් රු.මිලියන 2,300 ක්වූ භාණ්ඩාගාර ඇපකර 02 ක් පමණක් ලබා දී තිබුණි.

(ආ) ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙනුවෙන් වාණිජ බැංකු 02 කට නිකුත් කරන ලද භාණ්ඩාගාර ඇපකරවල වටිනාකම් පරීක්ෂාවේදී රජයේ මූල්‍ය ප්‍රකාශන වල සඳහන් වටිනාකම්, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් වටිනාකම් අතර එකතුව රු.මිලියන 886.84 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

## 4.5 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙළ කර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව එම වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් 2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව 2026 මැයි 20 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 4.6 ප්‍රසම්පාදනය

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය තුළ Security Arrangements ස්ථාපනය කිරීම වෙනුවෙන් සැපයුම්කරු වෙත රු.3,958,570 ක් ගෙවා තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 (අ) ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදනයේ මූලික පිරිවැය ඇතුලත් කර පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර ලංසු කැඳවීමට පෙර ඒ සඳහා අදාළ අනුමැතිය ලබා ගත යුතු වුවත් මෙහිදී එවැනි පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි.

(ii) ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා තිබුණද එක් ආයතනයක් පමණක් රු.3,509,800 (එකතුකළ අගය මත බදු රහිත) ලංසුවක් ඉදිරිපත් කර තිබූ අතර එම ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ලංසුව මූලික ඇස්තමේන්තුව සමඟ සියයට 38.5 ක විචලතාවක් පැවතුණි. එබැවින් 2025 ඔක්තෝබර් 02 දිනැති ලංසු ඇගයීම් කමිටුව විසින් සැපයුම්කරු සමඟ සාකච්ඡා කර අදාළ ලංසු මිල ගණන් අඩු කර ගැනීම සඳහා කටයුතු කරන ලෙසට නිර්දේශ ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ලංසු ඇගයීම් කමිටුව විසින් සඳහන් කරන ලද මූලික පිරිවැය ඇස්තමේන්තුව කොපමණද යන්න සඳහන් නොවූ බැවින් විචලතාවය ගණනය කළ ආකාරය විගණනයට පැහැදිලි නොවිය.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.10 ප්‍රකාරව, ලංසු යෝජනා වල මිල ගණන්, මුළු පිරිවැය ඇස්තමේන්තුවට වඩා සැලකිය යුතු ලෙස වැඩි වීම හා ප්‍රමාණවත් තරඟකාරී බවක් නොමැති බව තහවුරු වන අවස්ථාවක ලැබී ඇති ලංසු ප්‍රතික්ෂේප කළ හැකි වුවත් මෙම ප්‍රසම්පාදනයේදී ඒ සඳහා කටයුතු නොකර 2025 ඔක්තෝබර් 17 දිනැති ලංසු ඇගයීම් කමිටුවේ නිර්දේශය මත සැපයුම්කරු විසින් දෙවන වර ඉදිරිපත් කර තිබූ රු.3,354,720 ක ලංසු වටිනාකමට ප්‍රසම්පාදනය ප්‍රදානය කර තිබුණි.

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය

2025 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය 77 ක්ද තත්‍ය කාර්ය මණ්ඩලය 38 ක්ද වූයෙන් පුරප්පාඩු 39 ක් ව පැවතුණි. ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 21 ක් පැවතුණ අතර එය නියෝජ්‍ය අධ්‍යක්ෂ පුරප්පාඩු 12 ක්ද, අධ්‍යක්ෂ පුරප්පාඩු 06 ක්ද, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ගණකාධිකාරී හා නීති නිලධාරි යන තනතුරුවල පුරප්පාඩු 01 බැගින්ද පැවතුණි. තෘතියික මට්ටමේ පුරප්පාඩු 02 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි තනතුරු වලින්ද, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 11 සංවර්ධන නිලධාරි තනතුරු වලින්ද සමන්විත වී තිබුණි.

එස්. රත්නවීර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට